# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2045/56 - 2017 නොවැම්බර් මස 17 වැනි සිකුරාදා - 2017.11.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී.10/2017

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමග කියවිය යුතු, 29 වන වගන්තිය යටතේ සාදනු ලබන නියෝග.

**රනිල් වික්‍රමසිංහ,**
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය.

2017 නොවැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2017 අංක 1 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙන්දන් වන බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කරනු ලබන විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු අතර පනත ක්‍රියාත්මකවන දිනයේ දී ක්‍රියාත්මක විය යුතු ය.

**1 වන කොටස**

*ප්‍රාග්ධන ගනුදෙනු වර්ග*

2. (1) මේ නියෝගවල කාර්ය සඳහා පහත සඳහන් ප්‍රාග්ධන ගනුදෙනු බලයලත් වෙළෙන්දන් වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කරනු ලබන විදේශ විනිමයෙන් වූ බලයලත් ප්‍රාග්ධන ගනුදෙනු වර්ග විය යුතු ය:-

(අ) මේ නියෝගවල I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් සීමාවන්, නියමයන් සහ කොන්දේසිවලට යටත්ව ශ්‍රී ලංකාවේ යම් නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු;

(ආ) මේ නියෝගවල II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් සීමාවන්, නියමයන් හා කොන්දේසිවලට යටත්ව ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු;සහ

(ඇ) මේ නියෝගවල III වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් සීමාවන්, නියමයන් සහ කොන්දේසිවලට යටත්ව, ඉවත් කරන ලද විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ ප්‍රදානය කරනු ලැබූ යම් (සාමාන්‍ය හෝ විශේෂ) අනුමතයක් යටතේ සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු.

1A - G 26507 — 17 (2017/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) මේ නියෝගවල IVවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් වෙනත් ප්‍රාග්ධන ගනුදෙනු, බලයලත් වෙළෙන්දන් වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලයලත් වෙළෙන්දන් වශයෙන් පනතේ 4(1) (ඇ) වගන්තිය යටතේ විදේශ විනිමය වෙළෙඳාම් කිරීම සඳහා බලය ලබා දෙන ලෙස සලකනු ලැබ ඇති බලපත්‍රලාභී විශේෂ බැංකු සහ පනතේ 4(1)(ඇ) වගන්තිය යටතේ මහ බැංකුව විසින් විදේශ විනිමය වෙළෙඳාම් කිරීම සඳහා බලය ලබා දෙනු ලැබිය හැකි බලපත්‍රලාභී විශේෂ බැංකු විසින් IV වන උපලේඛනයේ සඳහන් සීමාවන්ට ද නියමයන් සහ කොන්දේසිවලට ද යටත්ව සිදු කරනු ලැබිය යුතු ය.

3. (1) ශ්‍රී ලංකාවෙන් පිටත යම් බැංකුවක් තුළ යම් ගිණුමක් විවෘත කිරීමට, පවත්වාගෙන යාමට හා ක්‍රියාත්මක කිරීමට සහ එකී ගිණුම් වසා දැමීමට අදහස් කරන්නා වූ, IV වන උපලේඛනයේ ඌ ශීර්ෂය යටතේ නිශ්චිතව සඳහන් යම් තැනැත්තකු විසින් මේ නියෝගවල කාර්ය සඳහා එසේ සිදු කරනු ලැබිය හැකි ය.

(2) (1) වන ඡේදය යටතේ විවෘත කළ යම් ගිණුමක් පනතේ විධිවිධාන යටතේ අවසරලත් ගිණුම් හිමියාගේ විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනුවක් සඳහා, ශ්‍රී ලංකාවෙන් පිටත දී නීත්‍යානුකූලව ලබාගත් හෝ අත්පත්කරගත් විදේශ ව්‍යවහාර මුදල්වලින් හෝ බලයලත් වෙළෙන්දකුගෙන් හෝ IV වන උපලේඛනයේ ඌ ශීර්ෂයේ 1 වන ඡේදයේ නිශ්චිතව සඳහන් ශ්‍රී ලංකාව තුළ සිටින තැනැත්තකුගෙන් ලබාගත් විදේශ ව්‍යවහාර මුදල්වලින් බැර කරනු ලැබිය හැකි ය.

(3) (1) වන ඡේදය යටතේ විවෘත කළ ගිණුම්වල අරමුදල්, ශ්‍රී ලංකාවේ නේවාසික යම් තැනැත්තකු සඳහා වන, අවසරලත් ගිණුම් හිමියාගේ ඕනෑම විදේශ විනිමය ගණුදෙනුවක් සඳහා පනතේ විධිවිධාන යටතේ යොදවනු ලැබිය හැකි ය.

(4) (5) වන ඡේදයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව, (1) වන ඡේදය යටතේ ප්‍රදානය කරන ලද අවසරයට අනුකූලව විදේශ බැංකුවක විවෘත කර පවත්වාගෙන යනු ලබන යම් ගිණුමක් වසා දැමූ අවස්ථාවක දී, එකී ගිණුම වසාදැමීම සිදු කර එක් මාසයක් ඇතුළත ගිණුමේ ශේෂය බැංකු පද්ධතිය හරහා ශ්‍රී ලංකාව වෙත ආපසු යවනු ලැබිය යුතු ය.

(5) ඉහත IV වන උපලේඛනයේ ඌ ශීර්ෂයේ (උ) අයිතමය යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත යම් ගිණුමක් විවෘත කිරීමට සහ පවත්වාගෙන යාමට අවසරලත් යම් තැනැත්තකුට ශිෂ්‍ය වීසා ලබා දීම යම් රටකින් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති අවස්ථාවක දී හෝ ශිෂ්‍ය වීසා ලබා ගැනීමෙන් පසු අධ්‍යයන කටයුතු ආරම්භ නොකිරීමට ඒ තැනැත්තා තීරණය කරනු ලබන අවස්ථාවක දී, එකී තැනැත්තා විසින්, මෙම අවසරය යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත එකී තැනැත්තා විසින් විවෘත කරන ලද ගිණුමේ බැරට පවතින සියලු මුදල්, එකී තීරණය ගත් දිනයේ සිට එක් මාසයක් ඇතුළත ආපසු ගෙවනු ලැබිය යුතු ය.

## II වන කොටස

### *සාමාන්‍ය කොන්දේසි යනාදිය*

4. (1) යම් බලයලත් වෙළෙන්දකු වශයෙන් වූ සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක්, යම් බලයලත් වෙළෙන්දකු වශයෙන් වූ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හරහා ප්‍රාග්ධන ගනුදෙනු සිදු කළ තැනැත්තන්, සුරැකුම්පත් නිකුත්කරන්නන් හා ණය ගැනුම්කරුවන් විසින්, ඔවුන් විසින් සිදු කරන ලද ප්‍රාග්ධන ගනුදෙනු, මෙම නියෝගය යටතේ අවසරලත් ගනුදෙනු වන බවට ඔප්පු කළ හැකි සියලු තොරතුරු හා ලේඛනගත සාක්ෂි, එකී ගනුදෙනු සිදු කිරීමෙන් වසර හයක කාලසීමාවක් දක්වා රඳවා තබා ගත යුතු ය.

(2) සුරැකුම්පත් ආයෝජනය කිරීම, ණය ලබා ගැනීම් හා බැරකම් මත ඇපවීම් සම්බන්ධයෙන් වන විට, එම තොරතුරු, එකී සුරැකුම්පත් බැහැර කරනු ලබන දිනයේ සිට ණය ආපසු ගෙවනු ලබන දිනයේ සිට හෝ ඇපය කල් ඉකුත් වනු ලබන දිනයේ සිට වසර හයක කාලසීමාවක් දක්වා තබා ගත යුතු ය.

(3) මේ නියෝග යටතේ යම් ප්‍රාග්ධන ගනුදෙනුවක්, බලයලත් වෙළෙන්දකු වන යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හරහා සිදු කරනු ලැබීමට අවසරලත් යම් තැනැත්තකු විසින්, අරමුදල් ගලා ඒම් හෝ ගලා යාම් පිළිබඳව ද, වත්කම් බැහැර කිරීම හෝ අත්පත් කරගැනීම, ප්‍රාග්ධන ගනුදෙනු මත ආදායම් හෝ ප්‍රතිලාභ ලැබීම් පිළිබඳව ද නිසියාකාරයෙන් නීත්‍යානුකූලව පිළිගනු ලබන ලේඛනගත සාක්ෂි සහ එකී ගනුදෙනුවල නීත්‍යානුකූලභාවය ප්‍රමාණවත්ව ඔප්පු කළ හැකි වෙන යම් ලේඛනගත සාක්ෂි තබා ගැනීම සහ පවත්වා ගැනීම සිදු කළ යුතු ය.

(4) බලයලත් වෙළෙන්දකු වන සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හා බලයලත් වෙළෙන්දකු වන බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හරහා ගනුදෙනු සිදු කරනු ලබන සෑම තැනැත්තකු විසින් ම, එම ගනුදෙනු සිදුවන අවස්ථාවල දී අවශ්‍ය වන ලේඛන සැපයීම මගින් මේ නියෝගවල විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම සඳහා පහසුකම් සලස්වනු ලැබිය යුතු ය.

5. මේ නියෝගවල කාර්ය සඳහා -

"පනත" යන්නෙන් 2017 අංක 12 දරන විදේශ විනිමය පනත අදහස් වේ;

"බලයලත් වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ප්‍රාග්ධන ගනුදෙනුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඇති අර්ථය ම තිබිය යුතු ය;

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඇති අර්ථයම තිබිය යුතු ය;

"පරිච්ඡින්න කරන ලද විනිමය පාලන පනත" යන්නෙන් (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනත අදහස් වේ;

## I වන උපලේඛනය

**(2(අ) වන නියෝගය)**

**ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු**

1. සුදුසුකම් ලත් නේවාසික ආයෝජකයකු විසින් බලයලත් වෙළෙන්දකු ලෙස ප්‍රාග්ධන ගනුදෙනු සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තන්ට ගෙවීම් සිදු කිරීම පිණිස යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් පහත සඳහන් කාර්ය සඳහා විදේශ විනිමය මිල දී ගත හැකි ය:-

(අ) ශ්‍රී ලංකාවෙන් පිට සංස්ථාපනය කරන ලද සමාගම්වල (විදේශීය සමාගම්) කොටස් හා ණය සුරැකුම්, නියාමනය කරන ලද ඒකක භාරවල සහ අන්‍යෝන්‍ය අරමුදල්වල ඒකක සහ ආයෝජනය සිදු කරන අවස්ථාවේ දී ශ්‍රී ලංකාවේ පවතින ස්වෛරී ණය ශ්‍රේණිගත කිරීම් කර ඇති ශ්‍රේණියක ශ්‍රේණිගත කර ඇති විදේශීය රජයන් විසින් කරනු ලබන ස්වෛරීත්ව බැඳුම්කර අත්කර ගැනීම සහ දැරීම සඳහා ;

(ආ) විදේශ රටක (පුද්ගලයකු නොවන වෙනත් තැනැත්තකු විසින්) ශාඛා, සම්බන්ධීකරණ, අලෙවිකරණ, අනුයෝජිත, ව්‍යාපෘති, නියෝජිත හෝ සමාන කාර්යාල (විදේශීය කාර්යාල) පිහිටුවීම සහ පවත්වාගෙන යාම සඳහා.

2. (1) ඉහත 1 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රාග්ධන ගනුදෙනු පහත දැක්වෙන 1 වන වගුවේ නිශ්චිතව දක්වා ඇති සීමාවන්ට යටත් විය යුතු ය :-

1 වන වගුව - ප්‍රතිමුඛ ආයෝජන සඳහා වන සීමාවන්

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| *සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයා* | *ආයෝජන/සාධන පත්‍ර වර්ගය* | *අවසරලත් සීමාව* |
| (i) කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත සමාගමක් | කොටස්, ඒකක, ණය සුරැකුම් සහ ස්වෛරීත්ව බැඳුම්කර | ලිත් වර්ෂයක් සඳහා එ.ජ.ඩො.2,000,000ක් හෝ මහ බැංකුව විසින් නම් කරනු ලැබූ යම් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන ප්‍රමාණයක්. |
| (ii) ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී කොටස් වෙළඳපොළක ලැයිස්තුගත නොකළ සමාගමක් | | ලිත් වර්ෂයක් සඳහා එ.ජ.ඩො. 500,000 ක් හෝ මහ බැංකුව විසින් නම් කරනු ලැබූ යම් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන ප්‍රමාණයක්. |
| (iii) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි හවුල් ව්‍යාපාරයක් | | ජීවිත කාලයටම එ.ජ.ඩො. 300,000ක් හෝ මහ බැංකුව විසින් නම් කරනු ලැබූ යම් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන ප්‍රමාණයක්. |
| (iv) තනි පුද්ගලයෙක් | | ජීවිත කාලයටම එ.ජ.ඩො. 200,000ක් හෝ මහ බැංකුව විසින් නම් කරනු ලැබූ යම් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන ප්‍රමාණයක්. |
| (v) සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක් | විදේශීය කාර්යාල පිහිටුවීම | ලිත් වර්ෂයක් සඳහා එ.ජ.ඩො. 300,000 ක් හෝ මහ බැංකුව විසින් නම් කරනු ලැබූ යම් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන ප්‍රමාණයක්. |

(2) ඉහත 1 වන වගුවේ නිශ්චිතව දක්වා ඇති ආයෝජන සඳහා වන සමස්ත සීමා, මේ නියෝග යටතේ සිදු කරන ලද සමස්ත ආයෝජන සහ පරිච්ඡින්න කරන ලද විනිමය පාලන පනත ප්‍රකාර නිකුත් කරන ලද 2011 ජනවාරි 01 වන දිනැති අංක 1686/50, 1686/52 සහ 1686/53 දරන ගැසට් නිවේදන මගින් ප්‍රදානය කරන ලද පොදු අවසරය ප්‍රකාරව මීට පෙර සිදු කරන ලද යම් ප්‍රතිමුඛ ගෙවීම් වලින් සංයුක්ත විය යුතු ය.

3. ඉහත දක්වා ඇති සීමා ඉක්මවන යම් ආයෝජනයක් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත අයදුම්පතක් ඉදිරිපත් කරනු ලැබ, 7 වන වගන්තිය ප්‍රකාරව මුදල් මණ්ඩලයේ විශේෂ අනුමැතියක් ලබා ගත යුතු වේ.

4. අවසරලත් ආයෝජන සිදු කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රතිමුඛ ප්‍රේෂණ, සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයා විසින් බලයලත් වෙළෙන්දකු වශයෙන් වූ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සමග ආරම්භ කර පවත්වාගෙන යන ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් හරහා සිදු කරනු ලැබිය යුතු ය.

5. එකී ආයෝජනවලින් ලැබෙන ආදායම සහ බහිෂ්කරණ ප්‍රතිෂ්ඨා මුදල් (නිකුත් කරන්නා විසින් කරන ලද සාංගමික ක්‍රියාවක්, අයිතියක් ක්‍රියාත්මක කිරීමක්, හිමිකමක් හෝ පරිවර්තනයක් ප්‍රකාර එම ආයෝජකයාට පසුව පැවරෙන කොටස් ඇතුළුව) ආරම්භක ආයෝජනය සිදු කරන ලද එම ප්‍රතිමුඛ ආයෝජන ගිණුම හරහාම ශ්‍රී ලංකාව තුළට ගෙන ආ යුතු ය.

6. සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයකු ම සියලුම ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් බලයලත් වෙළෙන්දකු වශයෙන් වූ එක් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සමග පවත්වාගෙන යා යුතු අතර බලයලත් වෙළෙන්දකු වශයෙන් වූ බලපත්‍රලාභී වාණිජ බැංකු එකකට වැඩි සංඛ්‍යාවක් සමග ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් ආරම්භ කොට පවත්වාගෙන යාමට අවශ්‍ය යම් ආයෝජකයකු විසින් බලයලත් වෙළෙන්දකු වශයෙන් වූ අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකුව හරහා ඉල්ලීමක් යොමු කිරීම මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගෙන් විශේෂ අනුමැතියක් ලබා ගත යුතු ය.

7. පරිච්ඡින්න කරන ලද විනිමය පාලන පනතේ හෝ මේ පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාවේ යම් නේවාසික තැනැත්තකුට විරුද්ධව කරන ලද චෝදනාවක් සම්බන්ධයෙන් එම තැනැත්තාට එරෙහිව නීති කෘත්‍යයක් හෝ විමර්ශන පවත්වාගෙන යන්නේ ද, එම තැනැත්තා මේ උපලේඛනය යටතේ අවසර ලබා දී ඇති කාර්යයන් සඳහා ප්‍රාග්ධන ගනුදෙනු සිදු කරගෙන යාමට සුදුසුකම් නොලබන්නේ ය.

8. යම් සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයකු විසින් අවසරලත් ආයෝජන සම්බන්ධයෙන් ප්‍රතිෂ්ඨාවක් ගෙවීමට නොතිබෙන අවස්ථාවක දී, සීමා රහිතව සහ මේ උපලේඛනයේ 2 වන ඡේදයේ 1 වන වගුවෙහි නිශ්චිතව සඳහන් සීමා නොතකා විදේශීය සමාගමක කොටස් අත්කර ගැනීම සහ දැරීම කරනු ලැබිය හැකි ය.

9. විදේශීය සමාගමක් විසින් ශ්‍රී ලංකාව තුළ ඇති එම සමාගමේ ශාඛාවක හෝ එහි පාලිත සමාගමක සේවකයන් වෙත පිරිනමනු ලැබූ සේවක කොටස් හිමිකම් සැලැස්ම හෝ සේවක කොටස් වරණීය ක්‍රමය හෝ පිළිබඳ සැලැස්ම යටතේ තමා වෙත පැවරුනු කොටස් සඳහා ගෙවීම් සිදු කිරීමට නියම කරනු ලැබ ඇති තැනැත්තකුට මේ උපලේඛනයේ 2 වන ඡේදයේ 1 වන වගුවේ නිශ්චිතව සඳහන් සීමාව අදාළ නොවිය යුතු ය. ඉහත සඳහන් කොටස් ලැබීම් සම්බන්ධයෙන් එම විදේශීය සමාගම් වෙත ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද පාලිත සමාගමෙන් හෝ ශාඛාවෙන් සෘජු ප්‍රේෂණ මත පදනම්ව ප්‍රතිෂ්ඨාවක් වශයෙන් බාහිර ප්‍රේෂණයක් සිදු කිරීම සඳහා යම් නියමයක් පවතින්නේ නම්, ගනුදෙනුවේ සද්භාවය පිළිබඳ සෑහීමට පත් වීම මත බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් බලයලත් වෙළෙන්දකු වශයෙන් එම අරමුදල් හුවමාරුව බලාත්මක කරනු ලැබිය හැකි ය.

10. මේ උපලේඛනයේ 2 වන ඡේදයේ 1 වන වගුවේ නිශ්චිතව සඳහන් අවසරලත් සීමාවන්ට යටත් වීමකින් තොරව, මේ උපලේඛනය යටතේ අවසර දෙනු ලැබූ කාර්යයන් සඳහා සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයකු වෙත, බාහිර ආයෝජන ගිණුම සඳහා බැර කරන ලද පූර්ව බාහිර ආයෝජනවල ප්‍රාග්ධන වටිනාකමින් සියයට පනහ දක්වා අරමුදල් උපයෝගී කර ගනිමින් ආයෝජන සිදු කිරීමට, අවසර ලබා දිය හැකි ය.

11. මේ උපලේඛනයේ කාර්ය සඳහා -

"මහ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"කොළඹ කොටස් වෙළෙඳපොළ" යන්නෙන් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පිහිටුවන ලද හා ලියාපදිංචි කරන ලද සහ 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් කොටස් වෙළෙඳපොළක් වශයෙන් ක්‍රියාත්මක වීම සඳහා බලපත්‍ර ලබා දෙනු ලැබූ කොළඹ කොටස් වෙළෙඳපොළ අදහස් වේ;

"සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයා" යන්නෙන් ඉහත 2 ඡේදයේ 1 වන වගුවෙහි 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් පරිදි වූ සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයකු අදහස් වේ;

"සේවක කොටස් හිමිකම් සැලැස්ම හෝ සේවක කොටස් වරණීය ක්‍රමය" යන්නෙන් ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරනු ලැබූ සමාගමක් එහි කොටස් හෝ සමූහ සමාගම්වල කොටස් ශ්‍රී ලංකාව තුළ ඇති එම සමාගමේ ශාඛාවක හෝ පාලිත සමාගමක සේවකයන් හට අත්කර ගැනීමට අවස්ථාවක් පිරිනමන සැලැස්මක් හෝ ක්‍රමයක් අදහස් වේ;

"මුදල් මණ්ඩලය" යන්නෙන් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

**II වන උපලේඛනය** **(2 (ආ) නියෝගය)**

**ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවේ දී බාර ගනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු**

**අ. අවසරලත් ආයෝජන**

1. ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවනු ලැබූ දේශීය අරමුදල්, ප්‍රාදේශීය අරමුදල්, ආයෝජන අරමුදල් සහ අන්‍යෝන්‍ය අරමුදල් ඇතුළත් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවට විදේශ විනිමය ප්‍රේෂණ කිරීම අවශ්‍ය කරනු ලබන විට, පහත සඳහන් වර්ගවල ප්‍රාග්ධන ගණුදෙනුවල ශ්‍රී ලංකාවේ දී නිරත වනු ලැබිය හැකි ය:-

(අ) 3 වන ඡේදයේ නිශ්චිතව සඳහන් බැහැර කිරීම්වලට යටත්ව සහ මේ උපලේඛනයේ අ ශීර්ෂය යටතේ 4 වන ඡේදයේ නිශ්චිතව සඳහන් සීමාවන් ට යටත්ව, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරනු ලැබූ සමාගම් මගින් නිකුත් කරනු ලැබූ (නිකුත් කරන්නාගේ සංස්ථායී ක්‍රියාවක් ප්‍රකාර හෝ යම් අයිතියක්, හිමිකමක් හෝ පරිවර්තනයක් ක්‍රියාත්මක කිරීම මගින් එකී ආයෝජකයා වෙත පසුකාලීනව පැවරෙන යම් කොටස් ද ඇතුළුව) සියලු පංතිවල කොටස් හෝ කොටස් සඳහා වූ හිමිකමක් ආයෝජනය කිරීම අත්කර ගැනීම හෝ දැරීම.;

(ආ) කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරනු නොලැබූ සමාගමක සියලු වර්ගයේ කොටස් ආයෝජනය කිරීම, අත්කර ගැනීම හෝ දැරීම;

(ඇ) ණය සුරැකුම්පත්හි ආයෝජනය කිරීම හෝ වසර තුනක කාලයක් හෝ ඊට වැඩි කාලයක් සඳහා (බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, විශේෂිත කල්බදු සමාගම් සහ ඇප මගින් සීමිත සමාගම් සහ විදේශීය සමාගම් හැර) ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරනු ලැබූ සමාගම් වෙත විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ණය ප්‍රදානය කිරීම;

(ඈ) අදාළ නියාමන අධිකාරිවල අනුමැතියට යටත්ව බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, විශේෂිත කල්බදු සමාගම් විසින් විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් නිකුත් කරනු ලැබූ ණය සුරැකුම්පත් හි ආයෝජනය කිරීම හෝ ඒ සඳහා ණය ප්‍රදානය කිරීම.

(ඉ) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට හෝ සීමාකිරීම්වලට යටත්ව, -

(i) ඒකක භාරවල හෝ අන්‍යෝන්‍ය අරමුදල්වල ඒකකයන් හි;

(ii) රජයේ සුරැකුම්පත් (භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර හෝ රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් යම් සුරැකුම්පත්);

(iii) ශ්‍රී ලංකා මහ බැංකුව හෝ වෙනත් යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් විසින් නිකුත් කරනු ලැබූ සුරැකුම්පත් හි;

(iv) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල (SLDBS);

(v) බලපත්‍රලාභි මූල්‍ය ආයතනයන් හි තැන්පතුවල;

(vi) නිශ්චල දේපළවල; හෝ

(vii) අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි විධානවලට අනුකූලව මුදල් මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වෙනත් යම් ආයෝජන වර්ගයන් හි,

ආයෝජනය කිරීම.

2. ඉහත අ ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (අ) සිට (ඊ) දක්වා අයිතමයන් හි නිශ්චිතව සඳහන්, බාර ගනු ලැබූ සියලු ප්‍රාග්ධන ගනුදෙනු බාර ගැනීම පහත සඳහන් කොන්දේසිවලට යටත් විය යුතු ය.

(අ) ඉහත සඳහන් ප්‍රාග්ධන ආයෝජන සඳහා අවශ්‍ය වනු ලබන සියලු අරමුදල් බලයලත් වෙළෙන්දකු වශයෙන් වූ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සමග,මහ බැංකුව විසින් යම් නම් කළ විදේශීය ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් පවත්වාගෙන යනු ලබන ආමුක ආයෝජන ගිණුමක් හරහා සපයනු ලැබිය යුතු ය.

(ආ) එකී ආයෝජන මගින් ලද සියලු ආදායම් සහ ආයෝජන බැහැර කිරීමෙන් ලද ප්‍රතිෂ්ඨා මුදල් ආයෝජනය සිදු කරනු ලැබූ ආමුක ආයෝජන ගිණුම බැර කරනු ලැබිය යුතු ය.

(ඇ) විජාතිකයකු වන්නා වූ තැනැත්තකුගෙන් උරුමයන් වශයෙන් පැවරෙන ලද්දා වූ (IV වන උපලේඛනයේ ආ ශීර්ෂය යටතේ (1) වන ඡේදයේ (1) වන අනුඡේදයේ නිර්වචනය කරනු ලැබ ඇති පරිදි වූ විගාමිකයන් හැර) සියලු ආදායම්, ඉහත ආයෝජන විකිණීමෙන් ලැබෙන සියලු මුදල්, (නිකුත් කරන්නාගේ සංස්ථායී ක්‍රියාවක්, අයිතිය ක්‍රියාත්මක කිරීමක්, හිමිකමක් හෝ පරිවර්තනයක් ප්‍රකාර ආයෝජකයා වෙත පසුව පැවරෙන යම් කොටස් ද ඇතුළුව) ආයෝජනය මේ උපලේඛනයේ අ ශීර්ෂය යටතේ 1 වන ඡේදයට අනුකූලවෙමින්, මුල් ආයෝජකගේ ආමුඛ ආයෝජන ගිණුම හරහා හෝ ආමුඛ ආයෝජන ගිණුමක් ලෙස නැවත නම් කරන ලද සුරැකුම්පත් ආයෝජන ගිණුමක් හරහා හෝ වෙනත් ගිණුමක් හරහා ආමුඛ ප්‍රේෂණයක් වශයෙන් සිදු කරන ලද්දේ නම්, ප්‍රතිලාභියා විසින් විවෘත කරන ලද ආමුඛ ආයෝජන ගිණුමක් හරහා ආපසු සියරට යැවිය හැකි ය.

(ඈ) ආයෝජනය සඳහා ආමුඛ ප්‍රේෂණයේ සාක්ෂි සැපයීමට යටත්ව ආයෝජකයකු විසින් විවෘත කරන ලද ආමුඛ ආයෝජන ගිණුමක් හරහා, මෙම නියෝගය බලාත්මක වන දිනට පෙරාතුව (පරිවර්තකයන්, හිමිකරුවන්, අයිතිවාසිකමක් ක්‍රියාවට නැංවීමක්,නිකුත් කරන්නා විසින් සිදු කරන ලද සංස්ථාගත ක්‍රියාවක් එකී ආයෝජකයා වෙත පසුව සිදු කරන කොටස් පැවරීමක් ඇතුළුව) ඉහත ආයෝජන විකිණීම මත ලැබූ සියලු ආදායම්, ප්‍රතිෂ්ඨා මුදල් ශ්‍රී ලංකාවෙන් පිටතට යවනු ලැබිය හැකි ය. 2010 ජනවාරි 1 වන දිනට පෙරාතුව සිදු කරන ලද ආයෝජන සම්බන්ධයෙන් ආයෝජනය සඳහා ආමුඛ ප්‍රේෂණයේ සාක්ෂි නොමැති අවස්ථාවක දී, බලයලත් ගණුදෙනුකරුවකු ලෙස බලපත්‍රලත් වාණිජ බැංකුවක් විසින් පාදක ගනුදෙනුවල සද්භාවය පිළිබඳ සෑහීමකට පත්වීම මත නේවාසික නොවන ආයෝජකයකු විසින් විවෘත කරන ලද ආමුඛ ආයෝජන ගිණුමක් හරහා ඉහත සඳහන් ප්‍රතිෂ්ඨා මුදල් සහ යම් ආයෝජන ආදායමක් ශ්‍රී ලංකාවෙන් පිටතට යවනු ලැබිය හැකි ය.

(ඉ) ආයෝජිත සමාගම, සමාගම් ලේකම්වරු සහ කොටස් තැරැව්කරුවන්, ඒකක භාර, අන්‍යෝන්‍ය අරමුදල් සහ මූල්‍ය ආයතන ඇතුළු සියලු අතරමැදියන් ඇතුළුව මේ උපලේඛනයේ 1 වන ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති ප්‍රාග්ධන ගනුදෙනුවල නියුතු නේවාසික ආස්ථිත්වයන් විසින්, ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තන් විසින් මේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති සියලු අවශ්‍යතාවයන්ට අනුකූලව එකී ප්‍රාග්ධන ගනුදෙනු සිදු කරන බව තහවුරු කිරීමට වගබලා ගතයුතු ය.

3. බැහැර කිරීම් .– මේ උපලේඛනයේ අ ශීර්ෂය යටතේ වන 1 ඡේදයේ (1)(අ) වන අනුඡේදය යටතේ වන අවසරය මෙහි පහත සඳහන් යම් ව්‍යාපාරයක් කරගෙන යන හෝ කරගෙන යාමට යෝජනා කරන සමාගමක කොටස් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(අ) භාණ්ඩ උකසට ගැනීම;

(ආ) වෙරළබඩ ධීවර කටයුතු ;

(ඇ) ප්‍රාග්ධනය ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ලබා දී ඇ.එ.ජ.ඩොලර් මිලියන 5 කට අඩුවන අවස්ථාවක දී සිල්ලර වෙළෙඳාම;

4. සීමා කිරීම් :

(1) මේ උපලේඛනයේ අ ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1)(අ) වන අනුඡේදය යටතේ වන අවසරය, මෙහි පහත සඳහන් යම් ව්‍යාපාරයක් කරගෙන යන හෝ කරගෙන යාමට යෝජනා කරන සමාගමක කොටස් සම්බන්ධයෙන්, එකී සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් 40% ක ප්‍රතිශතයක් දක්වා පමණක් හෝ යම් සමාගමක විදේශ ආයෝජන ඉහළ ප්‍රතිශතයක් සඳහා විශේෂ අනුමතයක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ප්‍රදානය කර ඇත්නම්, එකී ඉහළ ප්‍රතිශතය දක්වා පමණක් අදාළ විය යුතු ය.

(අ) ශ්‍රී ලංකාවේ අපනයන ජාත්‍යන්තර වශයෙන් තීරණය කරන ලද සලාක සීමා කිරීම්වලට යටත් වන අවස්ථාවක දී භාණ්ඩ නිෂ්පාදනය";

(ආ) තේ, රබර්, පොල්, කොකෝවා, වී, සීනි සහ කුළුබඩු වගාකිරීම සහ මූලික වශයෙන් සකස් කිරීම;

(ඇ) පතල් කැණීම සහ පුනර්ජනනීය ජාතික සම්පත් මූලික වශයෙන් සකස් කිරීම;

(ඈ) දේශීය දැව භාවිත කරනු ලබන දැව මූලික කර්මාන්ත;

(ඉ) (ධීවර විෂයය භාර අමාත්‍යාංශය විසින් අර්ථ දක්වනු ලබන පරිදි) ගැඹුරු මුහුදෙහි මසුන් ඇල්ලීම;

(ඊ) ජන සන්නිවේදනය;

(උ) අධ්‍යාපනය;

(ඌ) භාණ්ඩ ප්‍රවාහනය;

(එ) සංචාරක නියෝජ්‍යායතන;

(ඒ) නැව් ප්‍රවාහන නියෝජ්‍යායතන.

(2) යම් ව්‍යාපාරවල විදේශ ආයෝජන සඳහා අනුමතය ලබාදීම පිණිස පිහිටුවා ඇති යම් නීතිමය හෝ පරිපාලන අධිකාරියක් විසින් හෝ ශ්‍රී ලංකා රජය විසින් ප්‍රදානය කරනු ලබන පොදු හෝ විශේෂ අනුමතයක් ලබා දී ඇති, එම සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනයේ ප්‍රතිශතය දක්වා පමණක් මෙහි පහත නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක් කරගෙන හෝ කරගෙන යාමට යෝජනා කරන සමාගමක කොටස් සම්බන්ධයෙන්, මෙම අවසරය අදාළ විය යුතු ය :

(අ) ගුවනින් ප්‍රවාහනය කිරීම ;

(ආ) (නාවික විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යාංශය විසින් තීරණය කරනු ලබන පරිදි) වෙරළබඩ නැව් ප්‍රවාහනය ;

(ඇ) 1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධන පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති කර්මාන්තමය ව්‍යවසායක්, නාමිකව -

(i) ආයුධ, පතරොම්, පුපුරන ද්‍රව්‍ය, යුද්ධ වාහන සහ යුධ උපකරණ, ගුවන් යානා සහ අනෙකුත් යුධමය දෘඪාංග නිෂ්පාදනය කරනු ලබන යම් කර්මාන්තයක්,

(ii) වස, මත්ද්‍රව්‍ය, මද්‍යසාර, අන්තරායකර ඖෂධ සහ විෂ ද්‍රව්‍ය, උපද්‍රව සහිත හෝ පිළිකාකාරක ද්‍රව්‍ය නිෂ්පාදනය,

(iii) ව්‍යවහාර මුදල්, කාසි හෝ ආරක්ෂිත ලේඛන, නිෂ්පාදනය කරනු ලබන යම් කර්මාන්තයක්,

(ඈ) යාන්ත්‍රික කරන ලද මහා පරිමාණ මැණික් කැණීම; සහ

(ඉ) ලොතරැයි.

5. අ ශීර්ෂය යටතේ වන විධිවිධාන අර්ථ නිරූපණය කිරීමේ දී, සැක දුරුකිරීම සඳහා අදාළ වන පොදු මූලධර්මය වන්නේ, ආයෝජකයන් විසින් ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ විනිමය ප්‍රේෂණ භාවිත කරමින් ආයෝජනය සිදු කරන ලද සියලු අවස්ථාවන්හි දී යම් ප්‍රාග්ධන ලාභ ඇතුළු මෙම ඡේදයන් යටතේ අවසර දෙන ලද ආයෝජන බැහැර කිරීමෙන් පැන නගින ආදායම සහ ප්‍රතිෂ්ඨා මුදල් ශ්‍රී ලංකාවෙන් බැහැරට සියරට යැවීම කළ හැකි ය යන්න වන බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. ආයෝජකයකු විසින් මේ නියෝගයන් හි දක්වා ඇති කාර්ය පටිපාටිය අවශ්‍යතාවයන්ගෙන් අනුගමනය නොකර ඇති අවස්ථාවක දී, බලයලත් වෙළෙන්දකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හරහා සිදු කරන ලද ඉල්ලීමක් මත ඉල්ලීමෙහි සද්භාවය පිළිබඳව සෑහීමකට පත්වීමෙන් පසු මෙම මූලධර්මය සමග අනුකූලව ආයෝජකයකු විසින් සිදු කරනු ලබන බාහිර ප්‍රේෂණ සඳහා අනුමැතිය ලබා දීමට ශ්‍රී ලංකා මහ බැංකුව සතුව බලය තිබිය යුතු ය.

**(ආ) ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර ස්ථානයක් ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම.**

1. (1) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති විදේශීය සමාගමකට, ශ්‍රී ලංකාව තුළ -

(අ) මේ උපලේඛනයේ ආ ශීර්ෂය යටතේ 2 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියාකාරකම් හැර, යම් වාණිජ, වෙළෙඳ හෝ කර්මාන්ත කටයුත්තක් කරගෙන යා හැකි ය: එසේ වුව ද, මේ උපලේඛනයේ ආ ශීර්ෂය යටතේ 3 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියාකාරකම් සඳහා ශ්‍රී ලංකා රජය හෝ විදේශ ආයෝජන සඳහා අනුමතිය ප්‍රදානය කිරීමට පිහිටුවා ඇති යම් නෛතික හෝ පරිපාලන අධිකාරියක පූර්ව අවසරය ලබා ගෙන තිබිය යුතු ය; හෝ

(ආ) සම්බන්ධීකරණ කාර්යාලයක්, නියෝජිත කාර්යාලයක්, ප්‍රාදේශීය කාර්යාලයක් හෝ වෙනත් ඒ හා සමාන කාර්යාලයක් විසින් කිරීමට භාරගෙන ඇති හෝ සිදු කරනු ලබන්නා වූ, එසේ වුව ද එම ක්‍රියාකාරකම් සිදු කිරීමෙන් සමාගමට ඍජුව හෝ වක්‍රව යම් ආදායමක් සපයනු නොලබන්නා වූ , යම් වාණිජ, වෙළෙඳ හෝ කර්මාන්ත කටයුතු, නොවන යම් කටයුත්තක් සිදු කරනු ලැබිය හැකි ය.

(2) ඉහත සඳහන් යම් ක්‍රියාකාරකමක් කරගෙන යාමට භාරගෙන ඇති 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති යම් විදේශීය සමාගමක -

(අ) ව්‍යාපාර ස්ථානය, ශාඛා කාර්යාලයක්, ව්‍යාපෘති කාර්යාලයක් හෝ වෙනත් ඒ හා සමාන කාර්යාලයක් වන අවස්ථාවක දී, ශ්‍රී ලංකාවේ බලයලත් ගනුදෙනුකරුවකු ලෙස බලපත්‍රලත් වාණිජ බැංකුවක විවෘත කර ඇති විදේශීය සමාගමේ ගිණුමකට ආමුඛ ආයෝජන ගිණුමක් හරහා විදේශයන්ගෙන් ලද ප්‍රේෂණවලින් අවම වශයෙන් එ.ජ.ඩො. 200,000 ක් හෝ ඊට සමාන

නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලක් එකී විදේශීය සමාගමේ ගිණුමේ බැරට ආයෝජනය කළ යුතු අතර, එම ප්‍රේෂණයට අදාළ සාක්ෂි ලියාපදිංචියේ දින සිට දින තිහක් ඇතුළත් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙත සැපයිය යුතු ය.

(ආ) ව්‍යාපාර ස්ථානය සම්බන්ධීකරණ කාර්යාලයක්, නියෝජිත කාර්යාලයක් හෝ වෙනත් ඒ හා සමාන කාර්යාලයක් වන අවස්ථාවක දී එවැනි ව්‍යාපාරික ස්ථානයක් පිහිටුවීම සහ පවත්වාගෙන යාම සඳහා, අවශ්‍ය අරමුදල් ශ්‍රී ලංකාවේ බලයලත් ගණුදෙනුකරුවකු ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකුවක විවෘත කරන ලද ආමුඛ ආයෝජන ගිණුමක් හරහා විදේශීය සමාගමක ගිණුමක බැරට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

(3) ඉහත (1) වන අනුඡේදයේ සඳහන් විදේශීය සමාගමකට, ආයෝජන සිදු කළ එහි මවු සමාගමේ ආමුඛ ආයෝජන ගිණුම හරහා, බදු ගෙවූ පසු ලැබෙන ඔවුන්ගේ ලාභය නිෂ්පාදන භාගය, අධිකාරය හෝ වෙනත් ඊට සමාන ගෙවීම් හෝ අතිරික්ත අරමුදල් ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය කරනු ලැබිය හැකි ය. මේ නියෝගය බලාත්මක වන දිනට පෙරාතුව ලියාපදිංචි කරන ලද විදේශීය සමාගමක් විසින් පාදක ගණුදෙනුවේ සද්භාවය පිළිබඳව බලයලත් ගනුදෙනුකරු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුව සෑහීමට පත්වීමෙන් පසු එකී ගෙවීම් මව් සමාගමේ ආමුඛ ආයෝජන ගිණුම හරහා ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

2. මේ උපලේඛනයේ ආ ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1)(අ) වන අනුඡේදයේ කාර්යය සඳහා, පහත දැක්වෙන වාණිජ, වෙළෙඳ සහ කර්මාන්ත ක්‍රියාකාරකම් විදේශීය සමාගමක් විසින් ක්‍රියාත්මක කිරීමට අවසර ලබා දෙනු නොලැබේ :

(අ) (1988 අංක 30 දරන බැංකු පනත යටතේ ලියාපදිංචි වී ඇති විදේශ බැංකු ශාඛා හැර) මුදල් ණයට දීම ;

(ආ) භාණ්ඩ උකස් ගැනීම;

(ඇ) ප්‍රාග්ධනය ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තන් විසින් ලබා දී ඇති සහ එකී ආයෝජනය සිදු කිරීමෙන් පසුව එ.ජ.ඩො. මිලියන 5 කට අඩුවන අවස්ථාවක දී, සිල්ලර වෙළෙඳාම;

(ඈ) වෙරළබඩ මාළු ඇල්ලීම;

(ඉ) තේ, රබර්, පොල් සහ වී වගා කිරීම සහ මූලික වශයෙන් සකස් කිරීම;

(ඊ) පතල් කැණීම සහ නැවත පුනර්ජනනීය ජාතික සම්පත් මූලික වශයෙන් සකස් කිරීම ;

(උ) භාණ්ඩ ප්‍රවාහනය;

(ඌ) නැව් ප්‍රවාහන නියෝජිත ව්‍යාපාර;

(එ) යාන්ත්‍රික කරන ලද මැණික් කැණීම; සහ

(ඒ) ලොතරැයි;

3. මේ උපලේඛනයේ ආ ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1)(අ) වන අනුඡේදයේ වන අනුඡේදයේ කාර්යය සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් ශ්‍රී ලංකා රජයේ හෝ විදේශ ආයෝජන අනුමතිය ප්‍රදානය කිරීමට පිහිටුවන ලද යම් නීතිමය හෝ පරිපාලන අධිකාරියක් පූර්ව අනුමතිය සහිතව ක්‍රියාත්මක කිරීමට අවසර දෙනු ලැබේ :-

(අ) ශ්‍රී ලංකාවේ අපනයන ජාත්‍යන්තර වශයෙන් තීරණය කරන ලද සලාක සීමාකිරීම්වලට යටත්වන අවස්ථාවක දී, භාණ්ඩ නිෂ්පාදනය ;

(ආ) සීනි, කොකෝවා සහ කුළුබඩු වගා කිරීම සහ මූලික වශයෙන් සකස් කිරීම;

(ඇ) දේශීය දැව භාවිත කරනු ලබන දැව මූලික කර්මාන්ත;

(ඈ) ගැඹුරු මුහුදෙහි මාළු ඇල්ලීම;

(ඉ) ජන සන්නිවේදනය;

(ඊ) අධ්‍යාපනය;

(උ) ලංකාවෙන් පිටත සංචාරක නියෝජිත ව්‍යාපාර;

(ඌ) දේශීය ගුවන් මඟීන් ප්‍රවාහනය;

(එ) (i) ආයුධ, පතරොම්, පුපුරන ද්‍රව්‍ය, යුධ වාහන සහ ගුවන් යානා උපකරණ සහ යුධමය දෘඩාංග;

(ii) වස, මත්ද්‍රව්‍ය, මත්පැන්, අන්තරාදායක ඖෂධ සහ විෂ සහිත, උපද්‍රව සහිත හෝ පිළිකාකාරක ද්‍රව්‍ය; සහ

(iii) ව්‍යවහාර මුදල්, කාසි සහ ආරක්ෂිත ලේඛන,

සකසනු ලබන හෝ නිෂ්පාදනය කරනු ලබන යම් කර්මාන්තයක්.

4. ආ ශීර්ෂය යටතේ වන විධිවිධාන අර්ථ නිරූපණය කිරීමේ දී, සැක දුරුකිරීම සඳහා අදාළ වන පොදු මූලධර්මය වන්නේ, ආයෝජකයන් විසින් ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ විනිමය ප්‍රේෂණ භාවිත කරමින් ආයෝජනය සිදු කරන ලද සියලු අවස්ථාවන්හි දී මෙම ඡේදයන් යටතේ අවසර දෙන ලද ආයෝජන බැහැර කිරීමෙන් පැන නගින ආදායම සහ ප්‍රතිෂ්ඨා මුදල් ශ්‍රී ලංකාවෙන් බැහැරට සියරට යැවීම කළ හැකි ය යන්න වන බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. ආයෝජකයකු විසින් මේ නියෝගයන් හි දක්වා ඇති කාර්ය පටිපාටිය අවශ්‍යතාවයන්ගෙන් අනුගමනය නොකර ඇති අවස්ථාවක දී, බලයලත් වෙළෙන්දකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හරහා සිදු කරන ලද ඉල්ලීමක් මත ඉල්ලීමෙහි සද්භාවය පිළිබඳව සෑහීමකට පත්වීමෙන් පසු මෙම මූලධර්මය සමග අනුකූලව ආයෝජකයකු විසින් සිදු කරනු ලබන බාහිර ප්‍රේෂණ සඳහා අනුමැතිය ලබා දීමට ශ්‍රී ලංකා මහ බැංකුව සතුව බලය තිබිය යුතු ය.

5. මෙම උපලේඛනයේ කාර්යය සඳහා .–

"මහ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"ඇපයෙන් සීමිත සමාගම්" යන්නට 2007 අංක 7 දරන සමාගම් පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

"බලපත්‍රලාභී විශේෂිත බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"බලපත්‍රලාභී මූල්‍ය සමාගම" යන්නෙන් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ බලපත්‍රලත් සමාගමක් අදහස් වේ;

"බලපත්‍රලාභී මූල්‍ය ආයතනය" යන්නෙන් -

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක්;

(ආ) බලපත්‍රලාභී විශේෂ බැංකුවක්;

(ඇ) 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත යටතේ බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමක්;

(ඈ) විශේෂිත කල්බදු සමාගමක්; හෝ

(ඉ) බලපත්‍රලාභී මූල්‍ය ආයතනයක්;

අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මුදල් මණ්ඩලය" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"විදේශ සමාගම" යන්නට 2007 අංක 7 දරන සමාගම් පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"විශේෂිත කල්බදු සමාගම" යන්නෙන් 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් අදහස් වේ;

"ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර" යන්නෙන් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද එක්සත් ජනපද ඩොලර් මගින් හඳුන්වන ලද ණය සාධන පත්‍රයක් අදහස් වේ.

**(2(ඇ) නියෝගය)**

## III වන උපලේඛනය

**ඉවත් කරන ලද විනිමය පාලන පනතේ විධිවිධාන ප්‍රකාරව දැනටමත් ප්‍රදානය කර ඇති (සාමාන්‍ය හෝ විශේෂ) අනුමැතියක් යටතේ සිදු කරන ලද ප්‍රාග්ධන ගණුදෙනු**

මෙම නියෝග මගින් හෝ යම් පසුව එන නියෝගයක් මගින් විශේෂිතව වෙනස් කර ඇත්නම් මිස, මෙම නියෝගයන් හි I වන, II වන සහ IV වන උපලේඛනයන් හි නිශ්චිතව දක්වා ඇති ප්‍රාග්ධන ගනුදෙනුවලට සමාන, ඉවත් කරන ලද විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ පවතින සියලු ගණුදෙනු එකී ගණුදෙනු සඳහා නිශ්චිතව දක්වන ලද නියමයන් සහ කොන්දේසිවලට යටත්ව තවදුරටත් පවත්වාගෙන යා හැකි ය.

**IV වන උපලේඛනය** **(2 (2) සහ 4 වන නියෝග)**

## වෙනත් ප්‍රාග්ධන ගණුදෙනු

මේ උපලේඛනයේ අ සිට ඌ දක්වා වන ශීර්ෂ යටතේ නිශ්චිතව දක්වා ඇති අනෙකුත් සෑම ප්‍රාග්ධන ගණුදෙනුවක් ම බලයලත් ගණුදෙනුකරුවකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හරහා හෝ මෙම කාර්ය සඳහා 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය ලබා දී ඇති බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් සිදු කළ යුතු ය.

**(අ) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තන් විසින් දරනු ලබන නිශ්චිත දේපළ (ඉඩම් සහ ගොඩනැගිලි) විකුණුම් ප්‍රතිෂ්ඨා මුදල් ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය.**

1. ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුට ශ්‍රී ලංකා රුපියල් මගින් ගෙවා ඇති ප්‍රාග්ධන ලාභ ඇතුළු විකුණුම් ප්‍රතිෂ්ඨා මුදල් ඇත්නම්, එකී ගෙවීම් පහත සඳහන් කාර්යය සඳහා සහ ශ්‍රී ලංකාවේ නිශ්චල දේපළ අත්කර ගැනීමට, හිමිකමකට සහ භුක්තියට අදාළ නීතීන්ට යටත්ව ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික වන ශ්‍රී ලංකාවේ නිශ්චල දේපළ හිමිකරුවකු හෝ උරුමකරුවකු විසින් එකී දේපළ විකිණීම සම්බන්ධයෙන් ගෙවිය යුතු ප්‍රතිෂ්ඨාවක් වන අවස්ථාවක දී, එම විකුණුම් ප්‍රතිෂ්ඨා මුදල් ශ්‍රී ලංකාවෙන් පිටතට යැවීමට බලයලත් ගණුදෙනුකරුවකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවකට හෝ 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය පවරන ලද බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට අවසර ලබා දෙනු ලැබේ.

(අ) නිශ්චල දේපළෙහි මුල් අත්කරගැනීම ආමුඛ ආයෝජන ගිණුමක පැවති අරමුදල් භාවිත කරමින් සිදු කර ඇත්නම්, හිමිකරුගේ හෝ උරුමකරුගේ ආමුඛ ආයෝජන ගිණුමට බැර කිරීම.

(ආ) එකී දේපළෙහි අත්කර ගැනීම සහ සංවර්ධනය සඳහා වන (හිමිකරු විසින් නිශ්චල දේපළ අත්කර ගැනීම සඳහා පහසුකම් සළසන ලද ශ්‍රී ලංකාවේ තුන්වන පාර්ශ්වයකගේ ගිණුමකට හිමිකරු විසින් යවන ලද අරමුදල් ඇතුළුව) ආමුඛ ප්‍රේෂණයන් ඔප්පු කිරීම නිශ්චිතව දැන ගැනීම මත හිමිකරු හෝ උරුමකරු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගෙන යනු ලබන ගිණුමකට බැර කිරීම.

**(ආ) සංක්‍රමණික මාරු කිරීම්**

1. (1) ශ්‍රී ලංකාවේ නේවාසිකව සිටි ශ්‍රීලාංකිකයකුට සහ වෙනත් රටක ස්ථිර නේවාසිකත්වය හෝ ද්විත්ව පුරවැසිභාවය ද ඇතුළුව පුරවැසිභාවය ලබාගත් (මෙහි මින්මතු සංක්‍රමණිකයකු වශයෙන් හඳුන්වනු ලබන) තැනැත්තකු, එම සංක්‍රමණිකයා සතුව පැවති චංචල සහ නිශ්චල දේපළ, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් විකිණීමෙන් ලද ප්‍රතිෂ්ඨා මුදල් සහ ඔහුගේ කලත්‍රයාගෙන් හෝ දෙමව්පියන්ගෙන් ලද ත්‍යාග ඇතුළත් වන සංක්‍රමණික දීමනාවට සුදුසුකම් ලබයි. ප්‍රතිලාභීන් වශයෙන් උරුමයන් ලද වතු ඇතුළුව ශ්‍රී ලංකාවේ අයිතිව තිබෙන වටිනා ගල් වර්ග, වටිනා ලෝහ, පෞද්ගලික ස්වර්ණාභරණ සහ වෙනත් දේපළ වත්කම්වලට ඇතුළත් විය හැකි ය.

(2) පහත දැක්වෙන සීමාවන් ඉහත ආ ශීර්ෂයේ (1) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ගණුදෙනු සඳහා අදාළ විය යුතු ය:-

(අ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානයන්ට යටත්ව අවුරුදු 18 සහ ඊට වැඩි තැනැත්තකු සඳහා වන ආරම්භක සංක්‍රමනික දීමනාව වන එ. ජ. ඩො.200,000 ක්.

(ආ) වාර්ෂික සංක්‍රමණික දීමනාව වන එ. ජ. ඩො. 30,000 කි. ආරම්භක සංක්‍රමණික දීමනාව වන එ. ජ. ඩො. 200,000 සම්පූර්ණයෙන් ම භාවිතයෙන් මාස 12 කට පසු පළමු වාර්ෂික දීමනාව ගෙවිය හැකි ය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන විධානවලට යටත්ව, පළමු දීමනාව හැර පසුව ගෙවනු ලබන දීමනා වර්ෂයක් පාසා සහ එකතු කොට ගෙවිය හැකි ය.

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානයන්ට යටත්ව විදේශිකයන්ට උරුම ශ්‍රී ලංකාවේ ඇති දේපළ විකිණීමෙන් ලද ප්‍රතිෂ්ඨා මුදල් සම්බන්ධයෙන් වාර්ෂිකව එ. ජ. ඩො. 30,000 ක වාර්ෂික දීමනාවක්.

(3) සංක්‍රමණික දීමනාව බලපත්‍රලාභී බැංකුවක් හෝ 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය දී ඇති බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් හෝ බලපත්‍රලාභී ගණුදෙනුකරුවකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සමග ආරම්භ කරන ලද ප්‍රාග්ධන ගණුදෙනු රුපියල් ගිණුම (CTRA) හරහා බැර කරනු ලැබිය යුතු ය.

(4) බලයලත් වෙළෙන්දෙකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් හෝ 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය ලබා දී ඇති පරිදි බලපත්‍රලාභී නියෝජිත බැංකුවක් විසින් අනුමත කර ඇති පරිදි සුදුසුකම්ලත් විගමන දීමනාව ප්‍රාග්ධන ගණුදෙනු රුපියල් ගිණුමෙන් අයදුම්කරුගේ පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමට සහ/හෝ ශ්‍රී ලංකාවේ වන ආමුඛ ආයෝජන ගිණුමට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගෙන යනු ලබන විගාමිකයාගේ ගිණුමකට මාරුකරනු ලැබිය හැකි ය.

(5) වර්තමාන ආදායම (පොලිය, ලාභාංශ, විශ්‍රාම වැටුප්, බදු, විශ්‍රාමිකයාගේ කුලී බදු සහ ලාභ සමග) සහ විශ්‍රාම පාරිතෝෂික දීමනා ප්‍රතිලාභ (සේවා නියුක්තිකයන්ගේ අර්ථ සාධක අරමුදල (EPF), සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල (ETF), පාරිතෝෂිකය සහ වෙනත් යම් අනුමත විශ්‍රාම වැටුප් හෝ විශ්‍රාම අරමුදලක්) ප්‍රාග්ධන ගණුදෙනු රුපියල් ගිණුමට බැර කරනු ලැබිය යුතු අතර, විගමන දීමනාවට අමතරව පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට සහ/හෝ ශ්‍රී ලංකාවේ ආමුඛ ආයෝජන ගිණුමට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගෙන යනු ලබන විගාමිකයාගේ ගිණුමට මාරුකරනු ලැබිය යුතු ය.

2. විගාමිකයන් සහ/හෝ ශ්‍රී ලාංකීය සම්භවයක් ඇති විදේශිකයන් විසින් විදේශ ව්‍යවහාර මුදලකින් ලද උරුමව වූ වත්කම්වලින් ලත් මුදල්/ආදායම වේ නම්, එකී තැනැත්තන්ට එකී මුදල් බැර කිරීමේ කාර්යය සඳහා යම් නම් කළ විදේශ ව්‍යවහාර මුදලකින් ගිණුම් විදේශ විනිමය ආරම්භ කර පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ව අනුමතය ලබා ගත යුතු ය.

**ඇ. ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයන්ට ශ්‍රී ලංකාව තුළ දී ණය සහ අත්තිකාරම් ප්‍රදානය කිරීම**

බලයලත් වෙළෙන්දකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් හෝ 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය ලබා දී ඇති පරිදි බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් පහත දැක්වෙන කාණ්ඩවල තැනැත්තන්ට විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් යම් කාර්ය සඳහා ණය සහ අත්තිකාරම් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

1. ශ්‍රී ලංකාවෙන් පිටත වෙනත් රටක නිත්‍ය වාසික වීසා (PR) යටතේ වාසය කරන සහ ද්විත්ව පුරවැසිභාවය ලබා සිටින ශ්‍රී ලාංකිකයන්,

(1) ශ්‍රී ලංකාව තුළ නේවාසික දේපළක් අත්පත් කර ගැනීම/ඉදිකිරීම/සංවර්ධනය කිරීම සහ අලුත්වැඩියාව යන කාර්යය සඳහා විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ණය ප්‍රදානය කරනු ලැබිය යුතු ය.

(2) ණය ආපසු ගෙවීම සඳහා විදේශ ව්‍යවහාර මුදල් ඉපැයීම් ණයගැතියා සතුව පවතින්නේ නම් පමණක් විදේශ ව්‍යවහාර මුදල් ණය ප්‍රදානය කළ යුතු ය.

(3) විදේශ ව්‍යවහාර මුදල් පිළිගැනීමට අවසර ලබා දී ඇති නේවාසික දේපළ සංවර්ධනය කරනු ලබන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් පවත්වාගෙන යනු ලබන විදේශ විනිමය ගිණුම්වලට ප්‍රතිෂ්ඨා ණය මුදල් මාරු කරන ලෙස ණයගැතියා ඉල්ලා සිටින්නේ නම් මිස ප්‍රතිෂ්ඨා ණය මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) විදේශ ව්‍යවහාර මුදලින් ප්‍රදානය කරන ලද ණය, විදේශ ව්‍යවහාර මුදල් ආමුඛ ප්‍රේෂණ මගින් හෝ ණයගැතියාගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල පවතින අරමුදල් සහ ආමුඛ ආයෝජන ගිණුම් භාවිත කරමින් ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(5) ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රදානය කරන ලද ණය, විදේශ ව්‍යවහාර මුදල් ආමුඛ ප්‍රේෂණ මගින් හෝ ණයගැතියාගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල, සහ ආමුඛ ආයෝජන ගිණුම්වල පවතින අරමුදල් භාවිත කරමින් සහ ණයගැතියාගේ ශ්‍රී ලංකා රුපියල් ඉපැයීම් උපයෝගී කරගනිමින් ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(6) 2008 අංක 3 දරන බැංකු පනතේ විධාන (සංශෝධිත පරිදි) ප්‍රකාරව, ශ්‍රී ලංකා රුපියල්වලින් විදේශ ව්‍යවහාර ණය මුදල් අයකර ගැනීම් (ගෙවීම් පැහැර හැරීමේ දී) පියවාගත හැක්කේ අදාළ ණය, අඩුතරමින් අපේක්ෂිත මට්ටමට නැති ප්‍රවර්ගය යටතේ අක්‍රමික ණය ලෙස වර්ගීකරණය කරන ලද අවස්ථාවේ දී පමණක් පහත පරිදි වේ :-

(අ) පළමුව, ණය ගැතියාගේ විදේශ ව්‍යවහාර මුදල් වත්කම් මගින්;

(ආ) දෙවනුව, උකස් වත්කම් හෝ වෙනත් දේශීය වත්කම් විකිණීමෙන් ලද ප්‍රතිෂ්ඨා මුදල් මගින්;

(ඇ) අවසාන පිළියමක් වශයෙන්, ශේෂව පවතින යම් ණය ශේෂයක් පියවීමට අවශ්‍ය වන මුදල් ප්‍රමාණයට පමණක් ශ්‍රී ලංකා රුපියල් ප්‍රතිෂ්ඨා මුදල් පරිවර්තනය කළ යුතු ය.

2. විදේශයක රැකියාවේ නියුතු ශ්‍රී ලාංකිකයින් (විගාමිකයින් හැර)

(1) ණයගැතියාට ණය මුදල විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීමට හැකියාවක් පවතින්නේ නම්, බලයලත් වෙළෙන්දෙකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් හෝ 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය ලබා දී ඇති පරිදි බලපත්‍රලාභී විශේෂිත බැංකුවකින් ඕනෑම කාර්යයක් සඳහා ශ්‍රී ලංකාව තුළ භාවිත කිරීමට විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ණය සහ අත්තිකාරම් ලබාගත යුතු ය.

(2) එකී ණය ප්‍රදානය කිරීමට පෙර බලයලත් වෙළෙන්දකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් හෝ 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය ලබා දී ඇති පරිදි බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් හෝ එම ණය මුදල පිළිබඳ අවදානම තක්සේරු කළ යුතු ය.

(3) සින්නක්කර දේපළ (ඉඩම් හා ගොඩනැගිලි) මත උකස්කරයක් ලෙස හෝ විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු/වත්කම් මත ලියමක් ලෙස ණය අවදානම අඩු කර ගැනීම සඳහා ප්‍රමාණවත් සුරැකුමක් ලබාගැනීමෙන් අනතුරුව, විදේශ ව්‍යවහාර මුදලින්/ ශ්‍රී ලංකා රුපියල්වලින් ණය සහ අත්තිකාරම් ප්‍රදානය කළ යුතු ය.

(4) ණයගැතියාගේ අපේක්ෂිත විදේශගත සේවා නියුක්ති කාල සීමාව මත ණය මුදලේ කාලසීමාව තීරණය කළ යුතු අතර, බැංකු විසින් සාමාන්‍යයෙන් අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටියට අනුකූලව එකී ණය ගෙවනු ලැබිය යුතු ය.

(5) විදේශ ව්‍යවහාර මුදල් පිළිගැනීමට අවසර ලබා දී ඇති නේවාසික දේපළ සංවර්ධනය කරනු ලබන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් පවත්වාගෙන යනු ලබන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට ප්‍රතිෂ්ඨා ණය මුදල් මාරුකරන ලෙස ණයගැතියා ඉල්ලා සිටින්නේ නම් මිස රුපියල්වලින් ණයගැතියාට ප්‍රතිෂ්ඨා ණය මුදල ගෙවනු ලැබිය යුතු ය.

(6) විදේශ ව්‍යවහාර මුදල්වලින් ප්‍රදානය කරන ලද ණය, ආමුඛ ප්‍රේෂණ මගින් හෝ ණයගැතියාගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල ඇති ශේෂය හරහා විදේශ ව්‍යවහාර මුදලින් ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(7) ණයගැතියා රටින් පිටත සේවා නියුක්තව සිටින තාක් කල් ණයගැතියාගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල පවතින අරමුදල් පමණක් ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රදානය කරන ලද ණය මුදල් ගෙවීම සඳහා යොදා ගනු ලැබිය යුතු ය. එතෙර සේවා ගිවිසුම් අවසන් වූ පසු ණයගැතියා නැවත ශ්‍රී ලංකාවේ නේවාසිකයකු වන්නේ නම් පමණක් මේ ණය ගැතියා සතු ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීම කරනු ලැබිය හැකි ය.

(8) 2008 අංක 3 දරන බැංකු පනතේ විධාන (සංශෝධිත පරිදි) ප්‍රකාරව, ශ්‍රී ලංකා රුපියල්වලින් විදේශ ව්‍යවහාර මුදල් ණය අයකරගැනීම් (පැහැර හැරීම මත) පියවාගත හැක්කේ අදාළ ණය අඩු තරමින් අපේක්ෂිත මට්ටමට නැති ප්‍රවර්ගය යටතේ අක්‍රමික ණය ලෙස වර්ගීකරණය කරන ලද අවස්ථාවේ දී පමණක් පහත පරිදි වේ :-

(අ) පළමුව, ණයගැතියාගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමවල විදේශ ව්‍යවහාර මුදල් වත්කම්/තැන්පතු/ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල ශේෂය, ණය මුදලක් ගෙවීම සඳහා ඉල්ලුම් කිරීමෙන් පසු;

(ආ) දෙවනුව, ණයගැතියා විසින් උකසට තබන ලද වත්කම් හෝ වෙනත් දේශීය වත්කම් විකිණීමෙන් ලද ප්‍රතිෂ්ඨා මුදල් මගින්; සහ

(ඇ) අවසාන පිළියම වශයෙන්, ශේෂව පවතින යම් ණය ශේෂයක් පියවීමට අවශ්‍යවන මුදල් ප්‍රමාණයට පමණක් ශ්‍රී ලංකා රුපියල් ප්‍රතිෂ්ඨා මුදල් පරිවර්තනය කළ යුතු ය.

**ඇ. විදේශීය රටක අධ්‍යාපනයේ නියුතු ශ්‍රී ලාංකික සිසුන් විසින් ණය ලබා ගැනීම්**

1. අධ්‍යාපනික කාර්යය සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් ශ්‍රී ලාංකික පුරවැසියකු විසින්, තම අධ්‍යාපන කාලය තුළ අධ්‍යාපනයට/ ජීවන වියදම් සපුරාගැනීමට විදේශ රටවල පවතින බැංකුවලින්, මූල්‍ය ආයතනවලින්, විශ්වවිද්‍යාලවලින් හෝ අධ්‍යාපන ආයතනවලින් ණය ලබාගැනීමට සහ එම ණය මුදල් පියවීම සඳහා බලයලත් වෙළෙන්දෙකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හරහා හෝ 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය ලබා දී ඇති පරිදි බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් හරහා ශ්‍රී ලංකාවෙන් පිටතට අරමුදල් ප්‍රේෂණය කිරීමට අවසර දෙනු ලැබේ.

2. ශ්‍රී ලංකාවෙන් පිටත අධ්‍යාපන කටයුතුවල නිරත වන ශ්‍රී ලාංකික පුරවැසියන් ලබාගත් ණය පියවීමට ලංකාවේ සිටින ඔවුන්ගේ දෙමාපියන් හෝ භාරකරුවන් විසින් ණය ලබා දෙන ලද අදාළ ආයතනවලට ප්‍රතිමුඛ ප්‍රේෂණ සිදුකිරීම, බලයලත්

වෙළෙන්දකු වශයෙන් යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් හෝ 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය ලබා දී ඇති පරිදි බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් අදාළ ගනුදෙනු පිළිබඳව සද්භාවය පරීක්ෂා කිරීමෙන් අනතුරුව සිදු කරනු ලැබිය හැකි ය.

**ඉ. මූල්‍ය ව්‍යුත්පන්න ගනුදෙනුවලට අදාළ ගෙවීම්.**

බලයලත් වෙළෙන්දකු ලෙස යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ අවසරලත් යම් ජංගම ගනුදෙනුවලට සහ ප්‍රාග්ධන ගනුදෙනුවලට (පාදක ගනුදෙනුවලට) අදාළ මූල්‍යාමය ව්‍යුත්පන්න නිෂ්පාදන සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ විධානයේ ප්‍රකාරව එම පාදක ගනුදෙනුවල සද්භාවය පිළිබඳ සෑහීමට පත්වීමෙන් පසු, විදේශ විනිමය මගින් ගෙවීම් සිදු කළ හැකි ය.

**ඊ. භාණ්ඩ අපනයනකරුවන් විසින් භාණ්ඩ අපනයන මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත නැවත සියරට රැගෙන ඒම.**

1. සෑම භාණ්ඩ අපනයනකරුවකුම විසින් භාණ්ඩ අපනයන කිරීම මගින් ලද මුදල් එම අපනයනය කිරීම සිදු කළ දිනයේ සිට දින 120 ක් තුළ ශ්‍රී ලංකාවට නැවත රැගෙන එනු ලැබිය යුතු ය.

2. ඉහත නියමය උල්ලංඝනය කිරීමට විරුද්ධව යම් නඩු කටයුත්තක් ආරම්භ කිරීමට පෙරාතුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දින 120 අවසන් වීමෙන් පසු ව දින 30 ක සහන කාලසීමාවක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

3. සෑම භාණ්ඩ අපනයනකරුවකුම විසින්ම එක් එක් අපනයනය සම්බන්ධයෙන් අදාළ ලේඛන සාක්ෂි ගෙවීම ලබාගන්නා බලයලත් වෙළෙන්දකු වශයෙන් අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත හෝ 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය ලබා දී ඇති පරිදි බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වෙත ඉදිරිපත් කළ යුතු ය.

**උ. ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු විසින් නේවාසික නොවන තැනැත්තකු වෙනුවෙන් මුදල් ඇපකර නිකුත් කිරීම.**

1. බැංකු ඇපකර, බැඳුම්කර හෝ පොරොත්තු ණයවර ලිපි.

(1) බලයලත් වෙළෙන්දන් වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවලට හෝ 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය ලබා දී ඇති පරිදි බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ විධානයන්ට යටත්ව, ප්‍රාග්ධන ගනුදෙනුවලට අදාළව අවස්ථාවෝචිත පරිදි, පහත දැක්වෙන බැංකු ඇපකර,බැඳුම්කර හෝ පොරොත්තු ණයවර ලිපි නිකුත් කිරීමට සහ අලුත් කිරීමට අවසර ඇත්තේ ය :-

(අ) සාමාජිකත්වය සම්බන්ධයෙන් සාමාජිකයන්ගේ බැඳීම් සම්බන්ධ ගෙවීම් සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ බලපත්‍රලාභී විශේෂ බැංකුවල කාඩ්පත් මධ්‍යස්ථාන වෙනුවෙන් වීසා බලපත්‍ර වියදම් ආපසු ගෙවීම තහවුරු කිරීම සඳහා සමපාර්ශ්වීය ලෙස වන ඇපකර;

(ආ) ලංසුවෙහි/මිල කැඳවුමෙහි හෝ ගිවිසුමෙහි එකඟ වූ කොන්දේසිවලට යටත්ව, ශ්‍රී ලංකාවේ යම් නේවාසික තැනැත්තකු විසින් සිදුකරන ලද විදේශ කොන්ත්‍රාත්වලට අදාළව, ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික තැනැත්තකුගේ නමට එම ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තා වෙනුවෙන් නිකුත් කිරීමට අවශ්‍ය ලංසු බැඳුම්කර, කාර්යසාධන බැඳුම්කර, අත්තිකාරම් ගෙවීම්, ඇපකර එකී කාර්යය සඳහා අවශ්‍ය වෙනත් යම් ඇපකර එක් කොන්ත්‍රාත්තුවක් සඳහා එ.ජ. ඩො. මිලියන 1ක් දක්වා වන උපරිම සීමාවක් දක්වා නිකුත් කළ යුතු ය.

(ඇ) ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසිකයකු වන්නා වූ ප්‍රධාන බන්ධනදාරියා, බලයලත් වෙළෙන්දකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් හෝ 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය ලබා දී ඇති පරිදි බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් පිළිගත හැකි තත්ත්වයෙන් යුත් ශ්‍රී ලංකාවෙන් බැහැර පිළිගත් ජාත්‍යන්තර බැංකුවක් විසින් නිකුත් කළ ප්‍රතිඇපකරයක් ඊට අනන්‍ය කොන්දේසි මත පිළිගැනීමට යටත්ව, ශ්‍රී ලංකාව තුළ ඇති ගිවිසුමකට අදාළව ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකුගේ නමට ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසිකයකු වන්නා වූ ප්‍රධාන බන්ධනදාරියකු වෙනුවෙන් වන ඇපකරයක්;

(ඈ) ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික ප්‍රධාන බන්ධනදාරියාගෙන් බලයලත් වෙළෙන්දකු ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් හෝ 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය ලබා දී ඇති පරිදි බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් පිළිගත හැකි තත්ත්වයෙන් යුත් ශ්‍රී ලංකාවෙන් බැහැර පිළිගත් ජාත්‍යන්තර

බැංකුවක් විසින් නිකුත් කළ ප්‍රතිඅැපකරයක් ඊට අනන්‍ය කොන්දේසි මත ලබා ගැනීමට යටත්ව ගිවිසුමකට බන්ධනදායියා ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික තැනැත්තකු වන්නා වූ සිය ශ්‍රී ලංකාවේ නියෝජිතයා විසින්, ශ්‍රී ලංකාව තුළ ඇති වූ ගිවිසුමකට අදාළව ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකුගේ නමට එම ශ්‍රී ලංකා නියෝජිතයාගේ ඉල්ලීම මත ඇපකරයක් ලබා දිය යුතු විට දී වන ඇපකරයක්;

(ඉ) ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් (ආයෝජකයා) විසින් එකී ආයෝජකයා කොටස් හිමියකු වන්නා වූ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගමකට (ආයෝජිතයා), එම ආයෝජිතයා සංස්ථාගත කරනු ලැබූ රටේ මූල්‍ය ආයතනවලින් පහසුකම් ලබා ගැනීමට හැකියාව ලබා දීම සඳහා බැංකු ඇපකරයක් ලබා දීමට අවශ්‍ය වන විට දී, ඉවත් කළ විනිමය පාලන පනතේ විධිවිධානවලට හෝ මේ පනතේ විධිවිධානවලට අනුකූලව එකී ආයෝජිතයා විසින් එකී ආයෝජනය සිදු කර ඇත්තේ නම්, එ.ජ.ඩො.1,000,000ක උපරිම සීමාවකට යටත් වන ඇපකරයක්; එම ඇපකරයේ අංක යම් නිශ්චිත අවස්ථාවක දී ආයෝජිතයා තුළ ඇති ආයෝජකයාගේ කොටස් හිමිකාරිත්වයේ ප්‍රතිශතයට සමානුපාතික විය යුතු ය,

(ඊ) ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් (ආයෝජකයා) විසින් එකී ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවන ලද ශාඛාවකට එම ශාඛාව පිහිටුවා ඇති රටේ මූල්‍ය ආයතනවලින් පහසුකම් ලබා ගැනීමට හැකියාව ලබා දීම සඳහා බැංකු ඇපකරයක් ලබා දීමට අවශ්‍ය වන විට දී, ඉවත් කළ විනිමය පාලන පනතේ විධිවිධානවලට හෝ මේ පනතේ විධිවිධානවලට අනුකූලව එකී ශාඛාවේ එකී ආයෝජනය සිදු කර ඇත්තේ නම්, එම ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවන ලද එක් ශාඛාවක් සඳහා එ.ජ.ඩො.500,000 දක්වා වන ඇපකරයක් ලබා දිය හැකි ය.

(උ) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් කොන්ත්‍රාත්කරුවකු ලෙස ශ්‍රී ලංකාව තුළ ව්‍යාපෘතියක් සිදු කිරීමට භාර ගැනීමේ දී සහ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු විසින් උපකොන්ත්‍රාත්කරුවකුගේ තත්ත්වයෙන් එකී කොන්ත්‍රාත්කරුගේ නමට ඇපයක් ලබා දීමට අවශ්‍ය වන විට දී, ලංසුවෙහි/මිළ කැඳවුමෙහි හෝ ගිවිසුමෙහි එකඟ වූ කොන්දේසිවලට යටත්ව, ලංසු බැඳුම්කර, කාර්යසාධන බැඳුම්කර, අත්තිකාරම් ගෙවීම් නිකුත් කරනු ලැබිය හැකි ය. එකී කාර්යය සඳහා අවශ්‍ය වන යම් ඇපකර එක් කොන්ත්‍රාත්තුවක් සඳහා එ.ජ.ඩො. 1,000,000ක උපරිම සීමාවක් දක්වා ලබා දිය යුතු ය.

(ඌ) ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් දෙපාර්ශ්වය අතර ඇතිකර ගත් ගිවිසුමකට (නියෝජිත ගිවිසුම) යටත්ව සමාගමක් ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගමක (ප්‍රධානය) නියෝජිතයා ලෙස කටයුතු කරනු ලබන විට දී එකී නියෝජිත ගිවිසුමේ නියම කර ඇති පරිදි එම නියෝජිතයා වෙනුවෙන් ප්‍රධානයාගේ නමට එ.ජ.ඩො. 2,000,000ක උපරිම සීමාවක් දක්වා වූ ඇපකරයක් ලබා දිය යුතු ය.

**2. සංස්ථාපිත ඇපකර**

(1) ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් (ආයෝජකයකු) විසින් එකී ආයෝජකයා කොටස් හිමියකු වන්නා වූ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගමකට (ආයෝජිතයා) එම ආයෝජිතයා සංස්ථාපිත රටේ මූල්‍ය ආයතනවලින් පහසුකම් ලබා ගැනීමට හැකියාව ලබා දීම සඳහා සංස්ථාපිත ඇපකරයක් ලබා දීමට අවශ්‍ය වන විට දී, ඉවත් කළ විනිමය පාලන පනතේ විධිවිධානවලට හෝ මේ පනතේ විධිවිධානවලට අනුකූලව එකී ආයෝජිතයා තුළ එකී ආයෝජනය සිදු කර ඇත්තේ නම් සහ සංස්ථාපිත ඇපකරයේ වගකීම පියවීම සඳහා එම සමාගම් මූල්‍ය ශක්‍යතාව ප්‍රමාණවත් වන්නේ නම් එ.ජ.ඩො.1,000,000ක උපරිම සීමාවකට යටත් වන සංස්ථාපිත ඇපකරයක් ලබාදීමට ශ්‍රී ලංකාවේ සංස්ථාපිත යම් සමාගමකට අවසර ඇත්තේ ය. එම සංස්ථාපිත ඇපකරයේ පැන නගින යම් අභව්‍ය වගකීමක් පියවීම සඳහා එම සමාගමට මූල්‍ය ශක්තිය ඇති බවට එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කළ යුතු ය. ඇපකරයේ අගය යම් නිශ්චිත අවස්ථාවක දී එකී ආයෝජිතයා තුළ ආයෝජකයාගේ ඇති කොටස් හිමිකාරිත්වයේ ප්‍රතිශතයට සමානුපාතික විය යුතු ය.

(2) ඉහත 1 වන අනුඡේදයේ සඳහන් සමාගම් විසින් එකී ඇපකරය බලාත්මකවන දිනයේ සිට දින 14 ක් ඇතුළත ඉහත අවසරය යටතේ නිකුත් කරන ලද ඇපකරය පිළිබඳව තොරතුරු (සංස්ථාපිත ඇපකරයේ සහ අදාළ මණ්ඩලයේ යෝජනාවල පිටපත් ද ඇතුළුව) මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

3. ඉහත 1 වන සහ 2 වන ඡේදවන කාර්ය සඳහා -

(අ) බලයලත් වෙළෙන්දකු වශයෙන් යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවකට හෝ 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය ලබා දී ඇති පරිදි බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට, ඉහත සඳහන් ඇපකරවලට අදාළ වලංගු හිමිකම් වලින් පැන නගින ප්‍රතිමුඛ ප්‍රේෂණ සිදු කිරීම සඳහා ද අවසර ඇති අතර එම හිමිකමේ උපරිම සීමාව පාදක පහසුකමේ ඉතිරිව පවතින බැඳීමට සමානුපාතික හෝ ඊට වඩා අඩු විය යුතු ය.

(ආ) ඉහත සීමාවක් ඉක්මවන්නා වූ ඉහත ප්‍රවර්ගයක් යටතට අයත් නොවන්නා වූ යම් ඇපකරයක් සඳහා මේ පනතේ 7 වන වගන්තිය යටතේ මුදල් මණ්ඩලයේ විශේෂ අනුමතය අවශ්‍ය විය යුතු ය. මේ සම්බන්ධයෙන් වන ඉල්ලුම්පත්‍රයක් මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු ය.

**ඖ. 3 වන නියෝගය යටතේ ශ්‍රී ලංකාවෙන් බැහැර බැංකුවක ගිණුමක් ආරම්භ කිරීමට, පවත්වාගෙන යාමට සහ ක්‍රියාත්මක කිරීමට අවසර ලත් තැනැත්තන්.**

ශ්‍රී ලංකාවෙන් බැහැර බැංකුවක විදේශ විනිමය ගිණුමක් ආරම්භ කිරීමට, පවත්වාගෙන යාමට සහ ක්‍රියාත්මක කිරීමට පහත දැක්වෙන තැනැත්තන්ට අවසර ඇත්තේ ය. :-

(අ) ව්‍යාපාර සඳහා, අධ්‍යාපනය සඳහා හෝ වෛද්‍යමය කාර්ය සඳහා තාවකාලිකව ශ්‍රී ලංකාවෙන් බැහැරව නික්ම ගොස් ඇති ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු;

(ආ) ශ්‍රී ලංකාවෙන් බැහැර වෘත්තීමය හෝ වෘත්තීය සේවා සපයනු ලබන පුද්ගලයකු හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ සමාගමක් හෝ ව්‍යාපාර ආයතනයක් ;

(ඇ) ශ්‍රී ලංකාවෙන් බැහැර ආයෝජනය කිරීම සඳහා අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි විධානවලට අනුකූලව මුදල් මණ්ඩලය විසින් අවසර දෙන ලද යම් පුද්ගලයකු හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ සමාගමක් හෝ ව්‍යාපාර ආයතනයක්;

(ඈ) වෙළඳ භාණ්ඩ අපනයනකරුවන්;

(ඉ) වෙනත් රටකින් වලංගු ස්ථිර පදිංචිය සඳහා වන අවසරපත්‍රයක් ලබාගෙන ඇති තැනැත්තකු;

(ඊ) ද්විත්ව පුරවැසියකු ; සහ

(උ) වීසා බලපත්‍රයක් ප්‍රදානය කිරීම සඳහා වන කොන්දේසියක් ලෙස එකී රටේ බැංකුවක ගිණුමක් ආරම්භ කිරීමට සහ පත්වාගෙන යාමට වීසා බලපත්‍ර ප්‍රදානය කරනු ලබන අධිකාරිය විසින් එම තැනැත්තාට නියම කරන්නා වූ යම් රටක අධ්‍යාපනය ලැබීම සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව නික්ම යාමට අදහස් කරන්නා වූ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු.

**එ. මේ උපලේඛනයේ කාර්යය සඳහා -**

"මහ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

"සේවක අර්ථ සාධක අරමුදල" යන්නෙන් 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත යටතේ පිහිටුවන ලද සේවක අර්ථ සාධක අරමුදල අදහස් වේ.

"සේවා නියුක්තයන්ගේ භාර අරමුදල" යන්නෙන් 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල පනත යටතේ පිහිටුවනු ලැබූ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

"මුදල් මණ්ඩලය" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

එල්.ඩී.බී. 10/2017

**2017 අංක 17 දරන විදේශ විනිමය පනත**

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ සාදනු ලබන නියෝග.

**රනිල් වික්‍රමසිංහ,**
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය.

2017 නොවැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2017 අංක 2 දරන විදේශ විනිමය (ප්‍රාග්ධන ගනුදෙනුවල යෙදීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු අතර පනත ක්‍රියාත්මක වන දිනයේ දී ක්‍රියාත්මක විය යුතු ය.

I වන කොටස

***ගිණුම් විවෘත කිරීමේ බලය***

2. ප්‍රාග්ධන ගනුදෙනුවල දී ගනුදෙනු කිරීම සඳහා යම් තැනැත්තකුගේ නාමයෙන් විදේශ විනිමය ගිණුම් හෝ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් විවෘත කිරීමට පහත සඳහන් තැනැත්තන්ට බලය තිබිය යුතු ය. -

(අ) බලයලත් වෙළෙන්දකු වශයෙන් යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක්;

(ආ) පනතේ 4 (1) (ඇ) වගන්තිය යටතේ මහ බැංකුව විසින්, බලය ලබාදීමේ දී නිශ්චිතව සඳහන් කරන ලද කාර්ය සඳහා විදේශ විනිමය වෙළඳාම් කිරීමට බලය ලබා දෙන ලද ලෙස සලකනු ලැබිය යුතු යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්; සහ

(ඇ) පනතේ 4 (1) (ඇ) වගන්තිය යටතේ මහ බැංකුව විසින්, බලය ලබාදීමේ දී නිශ්චිතව සඳහන් කරන ලද කාර්ය සඳහා විදේශ විනිමය වෙළඳාම් කිරීමට බලය ලබා දෙනු ලැබිය හැකි යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්.

3. ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික යම් මූල්‍ය ආයතනයක් විසින් ශ්‍රී ලංකාවේ තැනැත්තන් වෙත ගෙවීම් සිදු කිරීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සමග විදේශ විනිමය ගිණුම් සහ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සිදු කරනු ලැබිය හැකිය.

4. බලයලත් වෙළෙන්දකු වශයෙන්, ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් හෝ 2 වන නියෝගයේ (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් වෙනත් රටවල විදේශ විනිමය ගනුදෙනු කාර්යක්ෂමව පියවීමේ පහසුකම් සැලසීම උදෙසා, ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවා ඇති බැංකුවක් සමග හෝ එවැනි බැංකුවක ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවා ඇති ශාඛා සමග නොස්ට්‍රො ගිණුම් (Nostro Accounts) විවෘත කිරීම හා පවත්වාගෙන යාම සිදු කරනු ලැබිය හැකිය.

II වන කොටස

***ගිණුම් වර්ග***

5. (1) බලයලත් වෙළෙන්දකු වශයෙන් යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් හෝ 2 වන නියෝගයේ (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් පහත දැක්වෙන ගිණුම් වර්ග විවෘත කිරීම හා පවත්වාගෙන යාම සිදු කළ හැකි යඃ-

(අ) ආමුඛ ආයෝජන ගිණුම් (Inward Investment Accounts - IIA)

(ආ) ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් (Outward Investment Accounts-OIA)

(ඇ) ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් (Capital Transactions Rupee Accounts- CTRA)

(ඇ) රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Diplomatic Foreign Currency Accounts - DFA)

(ඉ) රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් ( Diplomatic Rupee Accounts - DRA)

(2) ආමුඛ ආයෝජන ගිණුම්, ප්‍රතිමුඛ ආයෝජන ගිණුම්, ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් සහ රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ශ්‍රී ලංකා රුපියල්වලින් හෝ යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් (චෙක්පත් ඇණවීමේ පහසුකම නොමැතිව) ජංගම ගිණුම්, ඉතිරිකිරීමේ ගිණුම් හෝ කාලීන තැන්පතු ගිණුම් වශයෙන් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සිදු කරනු ලැබිය හැකි ය.

(3) පුද්ගලයන් විසින් පවත්වාගෙන යනු ලබන ආමුඛ ආයෝජන ගිණුම්, රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් තනි ගිණුම් හෝ තවත් සුදුසු තැනැත්තකු සමග බද්ධ ගිණුම් ලෙස පවත්වනු ලැබිය හැකි ය.

(4) බලයලත් වෙළෙන්දන් වශයෙන්, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් (1) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ගිණුම් එම බැංකුවල දේශීය බැංකු ඒකකවල විවෘත කිරීම හා පවත්වාගෙන යාම කරනු ලැබිය යුතු ය.

6. 5 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති යම් ගිණුමක් ශ්‍රී ලංකා රුපියල්වලින් හෝ මේ නියෝගවල I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට නිශ්චිතව දැක්විය හැකි පරිදි වෙනත් යම් ව්‍යවහාරික මුදලකින් විවෘත කිරීම හා පවත්වාගෙන යාම කරනු ලැබිය යුතු ය.

7. (1) යම් තැනැත්තකු විසින්මේ නියෝගවල II වන උපලේඛනයේ සඳහන් කර ඇති පරිදි යම් ගිණුමක් විවෘත කිරීමට සුදුසුකම් නොලබන අවස්ථාවක දී 5 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති යම් ගිණුමක් විවෘත නොකළ යුතු ය.

(2) බලයලත් වෙළෙන්දකු වශයෙන්, සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්ම හෝ 2 වන නියෝගයේ (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් ම 3 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති ගිණුමක් විවෘත කිරීමට හා පවත්වාගෙන යාමට බලාපොරොත්තු වන තැනැත්තන්, II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති නිර්ණායකයන් යටතේ එවැනි ගිණුමක් විවෘත කිරීමට හා පවත්වාගෙන යාමට සුදුසු බව නිසැකව දැන ගැනීමට නිසි උද්යෝගයකින් සහ සාධාරණ සැලකිල්ලක් ඇතිව කටයුතු කළ යුතු ය. බලයලත් වෙළෙන්දකු වශයෙන් සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්ම හෝ 2 වන නියෝගයේ (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් ගිණුම් හිමියන්ගේ සුදුසුකම් සනාථ කෙරෙන ඔවුන්ට අදාළ තොරතුරු සහ ලේඛනගත සාක්ෂි ගිණුම පවත්වාගෙන යන කාල සීමාවේදී සහ ගිණුමක් අවසන් කිරීමෙන් පසු අවුරුදු හයක කාලයක් පවත්වාගත යුතු ය.

(3) 3 වන නියෝගයේ නිශ්චිතව සඳහන් එක් එක් ගිණුම් වර්ග විවෘත කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ නිර්ණායක, එකී සෑම ගිණුම් වර්ගයක් සඳහාම අවසරලත් හර කිරීමේ හා බැර කිරීමේ සීමා, මෙම නියෝගවල II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

(4) මෙම නියෝගවල සඳහන් කිසිවක් මගින්, බලයලත් වෙළෙන්දන් වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු හෝ 2 වන නියෝගයේ (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති බලපත්‍රලාභී විශේෂිත බැංකු හෝ ගිණුම් හිමියන්, ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වූ වෙනත් යම් නීතියක විධිවිධාන සමග අනුකූල වීමෙන් වළක්වනු නොලැබිය යුතු ය.

## III වන කොටස

### *දැනට පවතින ගිණුම් නැවත නම් කරනු ලැබීම ආදිය*

8. බලයලත් වෙළෙන්දන් වශයෙන් සියලු බලපත්‍රලාභී වාණිජ බැංකු සහ 2 වන නියෝගයේ (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති බලපත්‍රලාභී විශේෂිත බැංකු, දෙදහස් දහ අටේ අප්‍රේල් 1 වන දින වන විට -

(අ) ඉවත් කරන ලද විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ විදේශ ව්‍යවහාර මුදල්වලින් හා ශ්‍රී ලංකා රුපියල්වලින් විවෘත කරන ලද හා පවත්වාගෙන යන, දැනට පවත්නා සියලු සුරැකුම්පත් ආයෝජන ගිණුම් (SIA) සහ විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම් (SFIDA), අභ්‍යන්තර ආයෝජන ගිණුම් (IIA) ලෙසින්; සහ

(ආ) දැනට පවතින සියලුම අනේවාසික රුපියල් ගිණුම් (NRRA), අනේවාසික අවහිර කළ ගිණුම් (NRBA) සහ සංක්‍රමික අවහිර කළ ගිණුම් (MBA), ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් (CTRA) ලෙසින්,

නැවත නම් කරනු ලැබිය යුතු ය.

9. මෙම නියෝගවල කාර්ය සඳහා -

"පනත" යන්නෙන්, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත අදහස් වේ;

"බලයලත් වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මහ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මූල්‍ය ආයතනය" යන්නට 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ මූල්‍ය ව්‍යාපාර පවත්වාගෙන යාමට බලපත්‍රලත් සමාගමක් අදහස් වේ;

"තැනැත්තා" යන්නට, (2 වන අධිකාරය වූ) අර්ථ නිරූපණ ආඥාපනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"බලපත්‍රලාභී වාණිජ බැංකුවක්" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"ප්‍රේෂණ" යන්නට, විදුලි පණිවිඩ හුවමාරු, වෙනත් අන්තර් බැංකු හුවමාරු, බැංකු අණකර, වෙනත් ගෙවීම් සාධනපත්‍ර , ජාත්‍යන්තරව පිළිගත් වෙනත් ගෙවීම් යාන්ත්‍රණ හරහා ලබාගත් ගෙවීම් ව්‍යවහාර මුදල් නෝට්ටු හැර විදේශයකින් විදේශ ව්‍යවහාර මුදල්වලින් විනිමය සමාගම්වලින් සහ නිවාසවලින් ලබාගත් අරමුදල් ඇතුළත් වේ;

"ඉවත් කරන ලද විනිමය පාලන පනත" යන්නෙන් (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනත අදහස් වේ.

**පළමුවන උපලේඛනය**

*(6 වන නියෝගය)*

***නම් කරනු ලැබූ විදේශ ව්‍යවහාර මුදල්***

(1). ඇමරිකා එක්සත් ජනපද ඩොලර්
(2). යූරෝ
(3). ස්ටර්ලිං පවුම්
(4). ඕස්ට්‍රේලියානු ඩොලර්
(5). සිංගප්පූරු ඩොලර්
(6). ස්වීඩන ක්‍රෝනර්
(7). ස්විස් ෆ්‍රෑන්ක්
(8). කැනේඩියානු ඩොලර්
(9). හොං කොං ඩොලර්
(10). ජපන් යෙන්
(11). ඩෙන්මාර්ක ක්‍රෝනර්
(12). නෝවේජියානු ක්‍රෝනර්
13). චීන රෙන්මින්බි
(14). නවසීලන්ත ඩොලර්

**දෙවන උපලේඛනය**

(7 වන නියෝගය)

***සුදුසුකම් ලැබීම සහ ගිණුම්වල අවසරලත් හර කිරීමේ සහ බැර කිරීමේ සීමා***

1. ආමුඛ ආයෝජන ගිණුම් (Inward Investment Accounts -IIA)

(1). ආමුඛ ආයෝජන ගිණුම් විවෘත කිරීම සඳහා සුදුසුකම් ලබන තැනැත්තන් -

(අ) ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විජාතිකයෙක්;

(ආ) ශ්‍රී ලාංකික සම්භවයක් ඇති, ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විජාතිකයෙක්;

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ශ්‍රී ලාංකික පුරවැසියෙක්;

(ඈ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද සමාගම්;

(ඉ) ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවා ඇති රාජ්‍ය සහ කලාපීය අරමුදල්, අන්‍යෝන්‍ය අරමුදල්, ඒකක භාර සහ අනෙකුත් ආයතනික ආයෝජකයින්;

(ඊ) යම් බලයලත් වෙළෙන්දකු සමග ආමුඛ ආයෝජන ගිණුමක් පවත්වාගෙන යනු ලැබූ මියගිය තැනැත්තෙකුගේ බූදලය අද්මිනිස්ත්‍රාසි කර අවසන් වන තෙක් එම මිය ගිය තැනැත්තාගේ බූදලයේ අද්මිනිස්ත්‍රසිකරු හෝ පොල්මංකරු;

(උ) නඩු කටයුතු අවසන් වනතෙක්, එකී බලපත්‍රලාභී වාණිජ බැංකුව සමග ආමුඛ ආයෝජන ගිණුමක් පවත්වාගෙන යන සමාගමක ලැබුම්කරු හෝ ඈවරකරු;

(ඌ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට බලය ලබා දෙනු ලැබිය හැකි වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් වර්ග.

(2). අවසරලත් බැර කිරීම්

(අ) ගිණුම් හිමියා වෙනුවෙන් බැංකු පද්ධතිය හරහා ශ්‍රී ලංකාවට පිටතින් ලැබෙන්නා වූ විදේශ විනිමය ප්‍රේෂණ;

(ආ) එකම ගිණුම් හිමියකුගේ පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, ආමුඛ ආයෝජන ගිණුම් හෝ අක්වෙරළ බැංකු ඒකකයක පවත්වාගෙන යන ගිණුම්වලින් කරනු ලබන හුවමාරු;

(ඇ) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයන් සඳහා ශ්‍රී ලංකාව තුළ කිරීමට අනුමත ප්‍රාග්ධන ගනුදෙනු සඳහා ලද ලාභාංශ, විකුණුම් හෝ කල්පිරීමේ ලැබීම්, ඈවර කිරීමේ බැහැර කිරීම්, ප්‍රාග්ධන නිදහස් කිරීම්, කොටස් නැවත ලබා ගැනීම්, ලාභ, අතිරික්ත මුදල්, කුලී ආදායම්, මුල් මුදල අය කර ගැනීම්, පොලිය හෝ වෙනත් අදාළ ආදායම් යනාදිය;

(ඈ) ප්‍රකාශයට පත් කිරීමෙන් පසු, ශ්‍රී ලංකාව තුළට රැගෙන එන ලද විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු (එනම්, එකී විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු, එ.ජ.ඩො. 15,000 ඉක්මවන හෝ එයට සමාන වන හෝ ශ්‍රී ලංකා රේගුවට ප්‍රකාශයට පත් කිරීමෙන් පසු වෙනත් යම් විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන වන අවස්ථාවක හෝ එකී විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු, එ.ජ.ඩො. 15,000 ට අඩුවන හෝ බලයලත් වෙළෙන්දකුට සුදුසු පරිදි ප්‍රකාශයට පත් කළ පසු වෙනත් යම් විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන වන අවස්ථාවක);

(ඉ) ආයෝජනය, ආමුඛ ආයෝජන ගිණුමක් (හෝ ගිණුම් හිමියාගේ නැවත නම් කරන ලද සුරැකුම්පත් ආයෝජන ගිණුමක් හෝ මේ නියෝග බලාත්මක වීමට පෙරාතුව කරන ලද නිසැකයෙන් තහවුරු කර ගත් ආමුඛ ප්‍රේෂණයන්) හරහා සිදු කර ඇති විට දී, නිශ්චල දේපළවලින් ලද ප්‍රාග්ධන ලාභ, කල්බදු හිමිකම්, උප කල්බදු හිමිකම් ඇතුළු ශ්‍රී ලංකා රුපියල් වලින් ලැබුණු විකුණුම් ලැබීම්,

(ඊ) ශ්‍රී ලාංකික නේවාසික තැනැත්තෙකුගේ (එනම් ණයකරු) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින්, ඉවත් කරන ලද විනිමය පාලන පනත හෝ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන යටතේ ප්‍රදානය කරන ලද යම් සාමාන්‍ය හෝ විශේෂ අනුමැතියක් යටතේ ගිණුම් හිමියාගෙන් (එනම් විදේශ ණය දෙන්නාගේ) විදේශ ව්‍යවහාර මුදලින් ලබාගත් ණය ආපසු ගෙවීමක් ලෙස කරනු ලබන මාරු කිරීම්;

(උ) ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙකු (එනම් ණයකරු) විසින් ගිණුම් හිමියාගෙන් (එනම් විදේශ ණය දෙන්නාගෙන්), ඉවත් කරන ලද විනිමය පාලන පනත හෝ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන යටතේ ප්‍රදානය කරන ලද යම් සාමාන්‍ය හෝ විශේෂ අනුමැතියක් යටතේ විදේශ ව්‍යවහාර මුදලින් ලබාගත් ණය ආපසු ගෙවීම් සඳහා විදේශ ව්‍යවහාර මුදල්වලට පරිවර්තනය කරන ලද ශ්‍රී ලංකා රුපියල්;

(ඌ) ගිණුම් හිමියාගේම රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම සහ රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම්වලින් සිදු කරනු ලබන මාරු කිරීම්.

(එ) (නිකුත් කරන්නා විසින් ගන්නා ලද සංස්ථාමය ක්‍රියාමාර්ගයක්, අයිතිවාසිකමක් ක්‍රියාත්මක කිරීමක්, හිමිකමක් හෝ පරිවර්තනයක් ප්‍රකාරව ආයෝජකයාට පසුකාලීනව පැවරෙන යම් කොටස් ඇතුළුව) ගිණුම් හිමියා විසින් එම ආමුඛ ආයෝජන ගිණුම මාර්ගයෙන්ම එම ආයෝජනය සිදුකර ඇති විට දී ගිණුම් හිමියා විසින් එම අවසර දෙන ලද ආයෝජන එම ගැණුම්කරුට විකිණීමට අදාළව වෙනත් යම් තැනැත්තකුගේ (එනම් ගැණුම්කරුගේ) ආමුඛ ආයෝජන ගිණුමෙන් සිදු කරන ලද ගනුදෙනු හෝ හුවමාරු කිරීම්.

(ඒ) මහ බැංකුව විසින් නිකුත් කළ විධානයන් මගින් අවසර දී ඇති පරිදි එම ගිණුම් හිමියාගේ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමෙන් සිදුකරන හුවමාරු.

(ඔ) අදාළ ගනුදෙනු හෝ හුවමාරු කිරීම් සිදු කිරීම සඳහා මහ බැංකුව විසින් නිකුත් කළ විධානයන් මගින් අවසර ලබා දී ඇති තාක් දුරට මහ බැංකුව විසින් කලින් කලට පවත්වාගෙන යාමට අවසර ලබා දෙනු ලැබිය හැකි වෙනත් යම් ගිණුම් වර්ගයකින් සිදු කරන ලද ගනුදෙනු හෝ හුවමාරු කිරීම්.

(ඕ) ගිණුමෙහි පවත්වාගෙන යන ලද අරමුදල්වලින් උපයා ගත් පොලී

(3). අවසර ලත් හර කිරීම්

(අ) ශ්‍රී ලංකා රුපියල්වලින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරන ගෙවීම්;

(ආ) ගිණුම් හිමියාගේ නමට සිදු කරන ප්‍රතිමුඛ ප්‍රේෂණ;

(ඇ) එම ගිණුම් හිමියාගේ ම ආමුඛ ආයෝජන ගිණුම්වලට, පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට හෝ අක්වෙරළ බැංකු ඒකක තුළ පවත්වාගෙන යන ගිණුම්වලට සිදු කළ හුවමාරු කිරීම්;

(ඈ) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ ප්‍රදානය කරන ලද අවසර ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික තැනැත්තන් විසින් ශ්‍රී ලංකාව තුළ සිදු කළ ප්‍රාග්ධන ගනුදෙනුවලට අදාළ ගෙවීම්;

(ඉ) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ ප්‍රදානය කරන ලද සාමාන්‍ය හෝ විශේෂ අනුමැතිය ප්‍රකාරව එකී ණය ලබාගෙන ඇති විට දී ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන්ට ලබා දෙන ලද විදේශ ව්‍යවහාර මුදල් ණයවලට අදාළ ගෙවීම්.

(ඊ) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ අවසරලත් විදේශ ප්‍රාග්ධන ගනුදෙනුවකට (එනම් ප්‍රතිමුඛ ආයෝජනයක්) මුදල් සැපයීමේ කාර්ය සඳහා එකී ණය ලබාගෙන ඇති විටදී, ණය ලබා ගන්නාගේ ප්‍රතිමුඛ ආයෝජන ගිණුමකට (ණය සුරැකුම් ඇතුළුව) විදේශ ව්‍යවහාර මුදල් ණයවලින් ලද ප්‍රතිෂ්ඨා මුදල් හුවමාරු කිරීම.

(උ) එකී ගිණුම් හිමියාගේ රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට සහ රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම්වලට සිදු කළ හුවමාරු කිරීම්.

(ඌ) ගිණුම් හිමියා විසින් එකී විකිණුම්කරුගේ සුරැකුම්පත් හෝ දේපළ මිලදී ගැනීම සම්බන්ධයෙන් වෙනත් තැනැත්තෙකුගේ (එනම් විකුණුම්කරුගේ) ආමුඛ ආයෝජන ගිණුමට සිදු කරන ලද හුවමාරු කිරීම්.

(එ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ විධානයන් මගින් එකී ගනුදෙනු සිදු කිරීම් සඳහා අවසර ලබා දී ඇතිතාක් දුරට, කලින් කලට, මහ බැංකුව විසින් පවත්වාගෙන යාමට අවසර ලබා දිය හැකි වෙනත් යම් ගිණුම් වර්ගයකට සිදු කළ හුවමාරු කිරීම්.

**2. ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් (OIA)**

(1). ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් විවෘත කිරීමට සුදුසුකම් ලබන තැනැත්තන්:-

(අ) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වූ යම් වගකීමෙන් සීමිත සමාගමක්;

(ආ) ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි වූ යම් හවුල් ව්‍යාපාරයක්;

(ඇ) ශ්‍රී ලංකාවේ නේවාසික තනි පුද්ගලයකු.

(2). යම් රාජ්‍ය නොවන සංවිධානයක්, ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් විවෘත කිරීමට හෝ පවත්වාගෙන යාමට අවසර නොලැබිය යුතු ය.

(3) ඉවත් කරන ලද විනිමය පාලන පනතේ හෝ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ වන නඩු පැවරීමක් සම්බන්ධයෙන් නීති කෘත්‍යය අවසන් නොවී පවතින්නේ යම් තැනැත්තකු, යම් සමාගමක් හෝ යම් හවුල් ව්‍යාපාරයකට විරුද්ධව ද, එම තැනැත්තා, එම සමාගම හෝ එම හවුල් ව්‍යාපාරය විසින් එම ප්‍රේෂණ සඳහා මහ බැංකුවෙන් ලබාගත් අනුමැතියකින් තොරව අවසරලත් ප්‍රාග්ධන හුවමාරුවක් සම්බන්ධයෙන් කිසිදු බාහිර ප්‍රතිමුඛ ප්‍රේෂණයක් සිදු කිරීම සඳහා අවසර දෙනු නොලැබිය යුතු ය.

(4) අවසරලත් බැර කිරීම්

(අ) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ නිකුත් කරනු ලබන නියෝගවල විධිවිධානයන්හි නිශ්චිතව දක්වා ඇති සීමාවන්ට යටත්ව, ආයෝජනය සඳහා අවශ්‍ය ප්‍රමාණයට පමණක් විදේශ ව්‍යවහාර මුදල් බවට පරිවර්තනය කළ, සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයන්ගෙන් ලද ශ්‍රී ලංකා රුපියල්.

(ආ) ගිණුම් හිමියාගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන් සිදු කරනු ලබන මාරු කිරීම්;

(ඇ) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ අනුමත විදේශීය ප්‍රාග්ධන ගනුදෙනු (එනම් ප්‍රතිමුඛ ආයෝජනයන්) මූල්‍යනය කිරීම සඳහා ණය දෙන්නාගේ ආමුඛ ආයෝජන ගිණුම හරහා එලෙස විදේශ මූලාශ්‍රවලින් ලබා ගන්නා ණය මුදල් (ණය සුරැකුම්පත් නිකුතුව ද ඇතුළත් ව).

(ඈ) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ සහ ඉවත් කරන ලද විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ, ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් හට ශ්‍රී ලංකාවෙන් පිටත දී සිදු කිරීමට අවසර ලබා දී ඇති ප්‍රාග්ධන ගනුදෙනු සඳහා එම ප්‍රාග්ධන ගනුදෙනු එම ප්‍රතිමුඛ ආයෝජන ගිණුමෙන් ම සිදු කර ඇති විට දී, (නිකුත් කරන්නා විසින් සිදු කරන ලද සංස්ථාමය ක්‍රියාමාර්ගයක්, අයිතියක් ක්‍රියාත්මක කිරීමක්, හිමිකමක් හෝ පරිවර්තනයක් ප්‍රකාරව ආයෝජකයා මත පසුව පැවරෙන යම් කොටස් ඇතුළුව) ලාභාංශ, විකුණුම් සහ කල් පිරීම්වලින් ලද ප්‍රතිෂ්ඨා මුදල්, ප්‍රාග්ධන ලාභ සහ ඇවර කිරීමෙන් ලද ප්‍රතිෂ්ඨා මුදල් කොටස්/ස්වෛරීත්ව බැඳුම්කර, ඒකක, ණය සුරැකුම්පත්වලින් ලැබිය යුතු ප්‍රාග්ධන අඩු කිරීම්, ලාභ, පර්යන්ත සහ අතිරික්ත අරමුදල්, කළමනාකරණ ගාස්තු, උපදේශක ගාස්තු සහ කොමිස් මුදල් සහ වෙනත් යම් ආශ්‍රිත ලැබීම් ආදී ප්‍රේෂණ.

(ඉ) අදාළ ගනුදෙනු හෝ හුවමාරු කිරීම් සිදු කිරීම සඳහා මහ බැංකුව විසින් නිකුත් කළ විධානයක් මගින් අවසර ලබා දෙනු ලැබිය හැකිතාක් දුරට මහ බැංකුව විසින් කලින් කලට පවත්වාගෙන යාමට අවසර ලබා දෙනු ලැබිය හැකි වෙනත් යම් ගිණුම් වර්ගයකින් සිදු කරන ලද ගනුදෙනු හෝ හුවමාරු කිරීම.

(ඊ) ගිණුමේ රඳවන ලද අරමුදල් මත උපයාගත් පොළිය.

(5) අවසරලත් හර කිරීම්

(අ) ගිණුම් හිමියා විසින් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ ප්‍රදානය කරන ලද අනුමතයන්ට අනුව ගිණුම් හිමියා විසින් කරන ලද ප්‍රාග්ධන ගනුදෙනු (ප්‍රතිමුඛ ආයෝජන) සඳහා වන ගෙවීම් (කාර්යාල පිහිටුවීමේ හා නඩත්තු කිරීමේ පිරිවැය, බැංකු ගාස්තු, බ්‍රෝකර් ගාස්තු, කොමිස් හෝ වෙනත් ගෙවීම් ද ඇතුළුව).

(ආ) ගිණුම් හිමියාගේ ජංගම ගනුදෙනු සඳහා ශ්‍රී ලංකාවෙන් පිටතට විදේශ ව්‍යවහාර මුදලින් කරනු ලබන ගෙවීම්.

(ඇ) පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හර කිරීමෙන් මූලික ආයෝජනයක් සිදු කර ඇති විට, එම විදේශීය ප්‍රාග්ධන ගනුදෙනු (ප්‍රතිමුඛ ආයෝජන) වලින්, ප්‍රතිමුඛ ආයෝජන ගිණුමට ලද ප්‍රාග්ධනය හා ප්‍රාග්ධන ලාභ, ගිණුම් හිමියාගේ පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට මාරු කිරීම්.

(ඈ) අදාළ ගනුදෙනු හෝ හුවමාරු කිරීම් සිදු කිරීම සඳහා මහ බැංකුව විසින් නිකුත් කළ විධානයක් මගින් අවසර ලබා දෙනු ලැබිය හැකි තාක් දුරට මහ බැංකුව විසින් කලින් කලට පවත්වාගෙන යාමට අවසර ලබා දෙනු ලැබිය හැකි වෙනත් යම් ගිණුම් වර්ගයක් වෙත සිදු කරන ලද ගනුදෙනු හෝ හුවමාරු කිරීම.

(ඉ) ශ්‍රී ලංකා රුපියල්වලින් සිදු කරනු ලබන මුදල් ආපසු ගැනීම්.

**3. ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් (CTRA)**

(1) ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් විවෘත කිරීමට සුදුසුකම් ලත් තැනැත්තන් -

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථිර නේවාසික තනි පුද්ගලයකු.

(ආ) ශ්‍රී ලාංකික සම්භවයක් ඇති , ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විජාතිකයකු.

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විජාතිකයකු.

(ඈ) ශ්‍රී ලාංකික ද්විත්ව පුරවැසිලාභියකු.

(ඉ) ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි කර ඇති විදේශ ආයතන සහ සමාගම්.

(ඊ) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ශ්‍රී ලාංකික ජාතිකයකු.

(2). අවසරලත් බැර කිරීම්

(අ) බැංකු පද්ධතිය හරහා ගිණුම් හිමියාගේ නමට ශ්‍රී ලංකාවෙන් පිටතින් විදේශ විනිමයෙන් ලැබෙන ප්‍රේෂණ;

(ආ) ගිණුම් හිමියා, ශ්‍රී ලංකාවේ විගාමික තනි පුද්ගලයකු, ශ්‍රී ලංකාවෙන් පිටත විජාතික නේවාසික තැනැත්තකු හෝ ශ්‍රී ලාංකික ද්විත්ව පුරවැසියකු වන අවස්ථාවක, ශ්‍රී ලංකාව තුළ ව්‍යුත්පන්න වූ නිශ්චල හා චංචල දේපළ අලෙවියෙන් ලබාගත් මුදල් සහ ස්පෘශ්‍ය/ස්පෘශ්‍ය නොවන වත්කම් ද ඇතුළුව දේශීය ආදායම;

(ඇ) අදාළ ගනුදෙනු හෝ හුවමාරු කිරීම් සිදු කිරීම සඳහා මහ බැංකුව විසින් නිකුත් කළ විධානයක් මගින් අවසර ලබා දෙනු ලැබිය හැකිතාක් දුරට මහ බැංකුව විසින් කලින් කලට පවත්වාගෙන යාමට අවසර ලබා දෙනු ලැබිය හැකි වෙනත් යම් ගිණුම් වර්ගයකින් සිදු කරන ලද ගනුදෙනු හෝ හුවමාරු කිරීම.

(ඈ) ගිණුමේ රඳවන ලද අරමුදල් මත උපයාගත් පොළිය.

(3) අවසරලත් හර කිරීම්

(අ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධානයන්ට අනුව සුදුසුකම්ලත් යම් ශ්‍රී ලාංකික විගාමිකයකුට සංක්‍රමණික දීමනා ලෙස එ.ජ.ඩො. 200,000 දක්වා ලැබෙන ප්‍රේෂණ;

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධාන ප්‍රකාරව, ඉහත සඳහන් 4 වන ඡේදයේ 3(අ) අනුඡේදයට අතිරේකව, සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික විගාමිකයකුට අදාළව වසරකට එ.ජ.ඩො.30,000 ක් බැගින් වූ දීමනා ප්‍රෙෂණ;

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධාන ප්‍රකාරව, විදේශීය ජාතිකයින්ට අදාළව ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වසරකට එ.ජ.ඩො. 30,000ක් බැගින් කරනු ලබන ප්‍රේෂණ;

(ඈ) ගිණුම්හිමියා, ශ්‍රී ලංකාවේ විගාමික තනි පුද්ගලයකු, ශ්‍රී ලංකාවෙන් පිටත විජාතික නේවාසික තැනැත්තකු හෝ ශ්‍රී ලාංකික ද්විත්ව පුරවැසියකු වන අවස්ථාවක, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධාන ප්‍රකාරව, සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාව, ගිණුම් හිමියාගේ පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට හෝ ආමුඛ ආයෝජන ගිණුමකට හුවමාරු කිරීම;

(ඉ) ශ්‍රී ලංකාව තුළ ශ්‍රී ලංකා රුපියල්වලින් සිදු කරන ලද ගෙවීම්.

(ඊ) අදාළ ගනුදෙනු හෝ හුවමාරු කිරීම් සිදු කිරීම සඳහා මහ බැංකුව විසින් නිකුත් කළ විධානයක් මගින් අවසර ලබා දෙනු ලැබිය හැකිතාක් දුරට මහ බැංකුව විසින් කලින් කලට පවත්වාගෙන යාමට අවසර ලබා දෙනු ලැබිය හැකි වෙනත් යම් ගිණුම් වර්ගයක් වෙත සිදු කරන ලද ගනුදෙනු හෝ හුවමාරු කිරීම.

**4. රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (DFA)**

(1) රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීමට සුදුසුකම්ලත් පුද්ගලයන්

(අ) රාජ්‍ය තාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍රයක් සහ ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන රාජ්‍ය තාන්ත්‍රික හැඳුනුම්පතක් සහිතව සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන නේවාසික වීසා ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබූ යම් විදේශ පුරවැසියකු;

(ආ) රාජ්‍ය තාන්ත්‍රික නොවන ගමන් බලපත්‍රයක් සහිත සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නේවාසික වීසා ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබූ යම් විදේශ පුරවැසියකු;

(2) අවසරලත් බැරකිරීම්

(අ) බැංකු පද්ධතිය හරහා ගිණුම් හිමියාගේ නමට ශ්‍රී ලංකාවට පිටතින් ලැබෙන්නා වූ විදේශ විනිමය ප්‍රේෂණ

(ආ) ශ්‍රී ලංකා රේගුවට ප්‍රකාශ කොට ගිණුම් හිමියා විසින් මෙරටට රැගෙන ආ විදේශ ව්‍යවහාර මුදල්;

(ඇ) එම ගිණුම් හිමියාගේම ආමුඛ ආයෝජන ගිණුම් හා අක්වෙරළ බැංකු ඒකකයේ පවත්වාගෙන යන ගිණුම්වලින් කරනු ලබන මාරුකිරීම්;

(ඈ) ගිණුම්හිමියා පිළිබඳව නොසළකා රාජ්‍ය දූත විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හා රාජ්‍ය දූත රුපියල් ගිණුම්වලින් කරනු ලබන මාරු කිරීම්;

(ඉ) අදාළ ගනුදෙනු හෝ හුවමාරුකිරීම් සිදු කිරීම සඳහා මහ බැංකුව විසින් නිකුත් කළ විධානයක් මගින් අවසර ලබා දෙනු ලැබිය හැකිතාක් දුරට මහ බැංකුව විසින් කලින් කලට පවත්වාගෙන යාමට අවසර ලබා දෙනු ලැබිය හැකි වෙනත් යම් ගිණුම් වර්ගයකින් සිදු කරන ලද ගනුදෙනු හෝ හුවමාරු කිරීම.

(ඊ) ගිණුමේ රඳවන ලද අරමුදල් මත විදේශ ව්‍යවහාර මුදලින් උපයන ලද පොලිය.

(3) අවසරලත් හර කිරීම්

(අ) ශ්‍රී ලංකාවෙන් පිටතට කරනු ලබන යම් ප්‍රතිමුඛ ප්‍රේෂණයන්;

(ආ) ගිණුම් හිමියාගේ දේශීය වියදම් සඳහා විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් කරනු ලබන ආපසු ගැනීම්;

(ඇ) එම ගිණුම් හිමියාගේම ආමුඛ ආයෝජන ගිණුම්වලට සහ අක්වෙරළ බැංකු ඒකකයේ පවත්වාගෙන යන ගිණුම්වලට කරනු ලබන මාරු කිරීම්;

(ඈ) ගිණුම්හිමියා පිළිබඳව නොසළකා රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට හා රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම්වලට කරනු ලබන මාරු කිරීම්;

(ඉ) වෙනත් යම් තැනැත්තකුගේ පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට කරනු ලබන මාරු කිරීම්;

(ඊ) අදාළ ගනුදෙනු හෝ හුවමාරුකිරීම් සිදු කිරීම සඳහා මහ බැංකුව විසින් නිකුත් කළ විධානයක් මගින් අවසර ලබා දෙනු ලැබිය හැකිතාක් දුරට මහ බැංකුව විසින් කලින් කලට පවත්වාගෙන යාමට අවසර ලබා දෙනු ලැබිය හැකි වෙනත් යම් ගිණුම් වර්ගයක් වෙත සිදු කරන ලද ගනුදෙනු හෝ හුවමාරු කිරීම.

**5. රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් (DRA)**

(1) රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් විවෘත කිරීමට සුදුසුකම්ලත් තැනැත්තන්-

(අ) රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍රයක් සහිත සහ ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන රාජ්‍ය තාන්ත්‍රික හැඳුනුම්පතක් සහිතව සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන නේවාසික වීසා ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබූ යම් විදේශ පුරවැසියකු;

(ආ) රාජ්‍ය තාන්ත්‍රික නොවන ගමන් බලපත්‍රයක් සහිතව සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නේවාසික වීසා ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබූ යම් විදේශ පුරවැසියකු;

(2) අවසර ලත් බැර කිරීම්

(අ) බැංකු පද්ධතිය හරහා ගිණුම් හිමියා වෙනුවෙන් ශ්‍රී ලංකාවට පිටතින් ලැබෙන විදේශ විනිමය ප්‍රේෂණ ;

(ආ) ශ්‍රී ලංකාවේ යම් තැනැත්තකුගෙන් ගිණුම් හිමියාට ලැබෙන මුදල් ආපසු ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීම් හා ගෙවීම් ;

(ඇ) ගිණුම් හිමියා විසින් ලියවිලි ඉදිරිපත් කිරීම මත ශ්‍රී ලංකාව තුළ ව්‍යුත්පන්න වූ, ගිණුම් හිමියා විසින් හිමිකම දරන මෝටර් වාහන අලෙවියෙන් ලබාගත් මුදල් ;

(ඈ) එම ගිණුම් හිමියාගේම ආමුඛ ආයෝජන ගිණුමෙන් සිදු කරන ලද මාරු කිරීම් ;

(ඉ) ගිණුම් හිමියා පිළිබඳව නොසළකා රාජ්‍ය තාන්ත්‍රික ව්‍යවහාර මුදල් ගිණුම් හා රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම්වලින් කරනු ලබන මාරු කිරීම් ;

(ඊ) අදාළ ගනුදෙනු හෝ හුවමාරු කිරීම් සිදු කිරීම සඳහා මහ බැංකුව විසින් නිකු් කළ විධානයක් මගින් අවසර ලබා දෙනු ලැබිය හැති තාක් දුරට මහ බැංකුව විසින් කලින් කලට පවත්වාගෙන යාමට අවසර ලබා දෙනු ලැබිය හැකි වෙනත් යම් ගිණුම් වර්ගයකින් සිදු කරන ලද ගනුදෙනු හෝ හුවමාරු කිරීම ;

(උ) ගිණුමේ රඳවන ද අරමුදල් මත ශ්‍රී ලංකා රුපියල්වලින් උපයන ලද පොලිය.

(3) අවසර ලත් හර කිරීම්

(අ) ශ්‍රී ලංකාව තුළ ශ්‍රී ලංකා රුපියල්වලින් කරනු ලබන වියදම් ;

(ආ) වීසා ගාස්තු ආපසු ගෙවීම්, ප්‍රතිපූර්ණයන් සහ ගිණුම් හිමියා සතුව තිබූ මෝටර් රථ වාහන විකිණීමෙන් ලත් මුදල් ලෙස ශ්‍රී ලංකාවෙන් පිටතට කරනු ලබන ප්‍රතිමුඛ ප්‍රේෂණ ;

(ඇ) ගිණුම් හිමියාගේම ආමුඛ ආයෝජන ගිණුම්වලට කරනු ලබන මාරු කිරීම් ;

(ඈ) ගිණුම් හිමියා පිළිබඳව නොසළකා රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට හා රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම්වලට කරනු ලබන මුදල් මාරු කිරීම් ;

(ඉ) අදාළ රේඛීය අමාත්‍යාංශය මගින් අනුමත කරන ලද වෙනත් යම් ගනුදෙනුවක් ;

(ඊ) අදාළ ගනුදෙනු හෝ හුවමාරු කිරීම් සිදු කිරීම සඳහා මහ බැංකුව විසින් නිකුත් කළ විධානයක් මගින් අවසර ලබා දෙනු ලැබිය හැකි තාක් දුරට මහ බැංකුව විසින් කලින් කලට පවත්වාගෙන යාමට අවසර ලබා දෙනු ලැබිය හැක වෙනත් යම් ගිණුම් වර්ගයක් වෙත සිදු කරන ලද ගනුදෙනු හෝ හුවමාරු කිරීම.

6. මේ උපලේඛනයේ කාර්යය සඳහා -

''ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව'' යන්නෙන් 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව අදහස් වේ.

එල්.ඩී.බී. 10/2017

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 5 වන සහ 8 වන වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 29 වන වගන්තිය යටතේ සාදනු ලබන නියෝග.

**රනිල් වික්‍රමසිංහ,**
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය.

2017 නොවැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2017 අංක 3 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගිණුම් විවෘත කිරීමේ හා පවත්වාගෙන යාමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු අතර පනත ක්‍රියාත්මක වන දිනයේ දී ක්‍රියාත්මක විය යුතු ය.

I **වන කොටස**

***ගිණුම් විවෘත කිරීමේ බලය***

2. යම් බලයලත් වෙළෙන්දකු හෝ ස්වකීය බලපත්‍රයේ නිශ්චිතව සඳහන් ප්‍රමාණය වනතෙක් පරිසීමිත වෙළෙන්දකුහට යම් තැනැත්තකුගේ නමින් විදේශ විනිමය ගිණුමක් විවෘත කිරීමට සහ පවත්වාගෙන යාමට බලය ලැබිය යුතු ය.

II **වන කොටස**

***ගිණුම් වර්ග***

3. (1)2 වන නියෝගය යටතේ යම් බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් පහත සඳහන් ගිණුම් වර්ග විවෘත කිරීම සහ පවත්වාගෙනයාම සිදුකරනු ලැබිය හැකි ය.

(අ) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Personal Foreign Currency Accounts - PFCAs);

(ආ) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Business Foreign Currency Accounts - BFCAs); හෝ

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට නිකුත් කරනු ලබන විධාන ප්‍රකාරව පවත්වාගෙන යාමට අවසර ලබා දෙනු ලැබිය හැකි වෙනත් යම් ගිණුම් වර්ග.

(2) බලයලත් වෙළෙන්දන් වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු සම්බන්ධයෙන් වන අවස්ථාවකදී, (1) වන ඡේදයේ නිශ්චිතව සඳහන් ගිණුම්, ඒවායේ දේශීය බැංකු ඒකක තුළ විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සිදුකරනු ලැබිය යුතු ය.

4.3 වන නියෝගයේ නිශ්චිතව සඳහන් යම් ගිණුමක්, ශ්‍රී ලංකා රුපියල්වලින් හෝ මේ නියෝගවල I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් යම් ව්‍යවහාර මුදලකින් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සිදු කරනු ලැබිය යුතු ය.

5. (1) යම් තැනැත්තකු විසින් මේ නියෝගවල II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් පරිදි යම් ගිණුමක් විවෘත කිරීමට සුදුසුකම් නොලබන අවස්ථාවක දී, එකී තැනැත්තා විසින් 3 වන නියෝගයේ නිශ්චිතව සඳහන් යම් ගිණුමක් විවෘත කරනු නොලැබිය යුතු ය.

(2) සෑම බලයලත් වෙළෙන්දකු හා පරිසීමිත වෙළෙන්දකු විසින් ම 3 වන නියෝගයේ නිශ්චිතව සඳහන් යම් ගිණුමක් විවෘත කිරීමට සහ පවත්වාගෙන යාමට බලාපොරොත්තු වන තැනැත්තන්, II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් උපමාන යටතේ එකී ගිණුම් විවෘත කිරීමට සහ පවත්වාගෙන යාමට සුදුසුකම් ලබන බව නිශ්චයකර දැන ගැනීම සඳහා නිසි උද්යෝගයකින් සහ සාධාරණ සැළකිල්ලක් සහිතව කටයුතු කළ යුතු ය. සෑම බලයලත් වෙළෙන්දකු හා පරිසීමිත වෙළෙන්දකු විසින්ම ගිණුම් හිමියන්ගේ සුදුසුකම

සනාථ කරන්නා වූ ගිණුම් හිමියා පිළිබඳ තොරතුරු හා ලේඛනගත සාක්ෂිගිණුම පවත්වාගෙන යනු ලබන කාල සීමාව ඇතුළත සහ ගිණුම වසා දැමීමෙන් පසු වසර හයක කාල සීමාවක් දක්වා පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(3) 3 වන නියෝගයේ නිශ්චිතව සඳහන් එක් එක් ගිණුම් වර්ග විවෘත කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ උපමාන, එකී සෑම ගිණුම් වර්ගයක් සඳහාම අවසරලත් හර කිරීමේ හා බැර කිරීමේ සීමා, මෙම නියෝගවල II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි විය යුතු ය.

(4) මේ නියෝගවල සඳහන් කිසිවක් මගින්, බලයලත් වෙළෙන්දන් පරිසීමිත වෙළෙන්දන් හෝ ගිණුම් හිමියන්, ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වූ වෙනත් යම් නීතියක විධිවධාන සමග අනුකූල වීමෙන් වළක්වනු නොලැබිය යුතු ය.

III වන කොටස

*දැනට පවතින ගිණුම් නැවත නම් කරනු ලැබීම ආදිය*

6. (1)සෑම බලයලත් වෙළෙන්දකු හා පරිසීමිත වෙළෙන්දකු විසින්ම දෙදහස් දහ අටේ අප්‍රේල් මස 1 වන දින වන විට -

(අ) ඉවත් කරන ලද (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ විවෘත කරන ලද හා පවත්වාගෙන යන, දැනට පවත්නා සියලුම අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Non-Resident Foreign Currency Accounts - NRFCs), නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Resident Foreign Currency Accounts - RFCs), නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ( Resident Non Nationals'Foreign Currency Accounts - RNNFCs) සහ අනේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ( Non Resident Non National Foreign Currency Accounts - NRNNFAs), පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්(Personal Foreign Currency Accounts -PFCAs), ලෙසින් ද;

(ආ) දැනට පවතින සියලු ම විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් (Foreign Exchange Earners Accounts - FEEAs),ආමුඛ ප්‍රේෂණ බෙදා හැරීමේ ගිණුම් (Inward Remittance Distribution Accounts - IRDAs) සහ විදේශ නැව් සේවා හෝ ගුවන් සේවා නියෝජිතයින් සඳහා වූ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Foreign Currency Accounts for Agents of Foreign Shipping Lines or Air Lines - FCAASAs), ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Business Foreign Currency Accounts - BFCAs) ලෙසින් ද,

නැවත නම් කරනු ලැබිය යුතු ය.

(2) දැනට පවත්නා සියලු ආගන්තුකයින් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ විදේශීය ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වන විශේෂ ගිණුම්, දෙදහස් දහඅටේ ජනවාරි 1 වන දින සිට නැවත නම් කරනු ලැබීමෙන් තොරව දිගටම පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(3) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (PFCAs) සහ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් (BFCAs), (චෙක්පත් ලිවීමේ පහසුකම නොමැතිව) ජංගම, ඉතිරි කිරීමේ හෝ කාලීන තැන්පතු ගිණුම් වශයෙන්, නම් කරන ලද යම් විදේශ ව්‍යවහාර මුදලකින් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සිදු කරනු ලැබිය යුතු ය. එම ගිණුම් අතරින්, තනි පුද්ගලයන් විසින් පවත්වාගෙන යනු ලබන පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, වෙනත් සුදුසුකම්ලත් තැනැත්තකු සමග තනි හෝ බද්ධ ගිණුම් වශයෙන් දරනු ලැබිය හැකි ය.

7. මේ නියෝගවල කාර්ය සඳහා -

"බලයලත් වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"මහ බැංකුව" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"තැනැත්තා" යන්නට අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ප්‍රේෂණ" යන්නට විදුලි මුදල්, වෙනත් අන්තර් බැංකු හුවමාරු, බැංකු අණකර, වෙනත් ගෙවීම් සාධන පත්‍ර, ජාත්‍යන්තරව පිළිගත් වෙනත් ගෙවීම් යාන්ත්‍රණ හා පරිශ්‍ර හරහා ලැබුණු ගෙවීම් හෝ ව්‍යවහාර මුදල් නෝට්ටු හැර, විදේශයකින් විදේශ ව්‍යවහාර මුදල්වලින්, විනිමය සමාගම්වලින්/ නිවාස වලින් ලැබුණු අරමුදල් ඇතුළත් වේ.

"පරිසීමිත වෙළෙන්දා" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

## පළමුවන උපලේඛනය

*(4 වන නියෝගය)*

***නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්***

(අ) එක්සත් ජනපද ඩොලර් (එ.ජ.ඩො.)
(ආ) යූරෝ
(ඇ) ස්ටර්ලිං පවුම්
(ඈ) ඔස්ට්‍රේලියානු ඩොලර්
(ඉ) සිංගප්පූරු ඩොලර්
(ඊ) ස්වීඩන ක්‍රෝනර්
(උ) ස්විස් ෆ්‍රෑන්ක්
(ඌ) කැනේඩියානු ඩොලර්
(එ) හොං කොං ඩොලර්
(ඒ) ජපන් යෙන්
(ඔ) ඩෙන්මාර්ක ක්‍රෝනර්
(ඕ) නෝවේජියානු ක්‍රෝනර්
(ක) චීන රෙන්මින්බි
(ග) නවසීලන්ත ඩොලර්

## II වන උපලේඛනය

*(5 වන නියෝගය)*

***සුදුසුකම් ලැබීම සහ ගිණුම්වල අවසරලත් හර කිරීමේ සහ බැර කිරීමේ සීමා***

1. පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Personal Foreign Currency Accounts - PFCAs)

(1). පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීමට සුදුසුකම් ලබන තැනැත්තන්

(අ) යම් බාලවයස්කරුවකු ඇතුළුව, ශ්‍රී ලාංකික ජාතිකයකු වන යම් පුද්ගලයකු;

(ආ) යම් බාලවයස්කරුවකු ද ඇතුළුව, ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයකු වන, ශ්‍රී ලාංකික සම්භවයක් සහිත පුද්ගලයකු;

(ඇ) විජාතිකයකු වන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු;

(ඈ) තාවකාලික සංචාරයක් මත ලංකාවට පැමිණි හෝ ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට අදහස් කරන විජාතික තැනැත්තකු;

(ඉ) බලයලත් වෙළෙන්දා හෝ පරිසීමිත වෙළෙන්දා සමග පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් පවත්වාගෙන යනු ලැබූ මියගිය තැනැත්තකුගේ බූදලය අද්මිනිස්ත්‍රාසි කර අවසන් වන තෙක් එම මිය ගිය තැනැත්තාගේ බූදලයේ අද්මිනිස්ත්‍රාසිකරු හෝ පොල්මඃකරු.

(2). අවසරලත් බැර කිරීම්

(අ) බැංකු පද්ධතිය හරහා ගිණුම් හිමියාගේ නමට, විදේශ විනිමයෙන්, ශ්‍රී ලංකාවෙන් පිටතින් ලබාගත්;

(ආ) මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධාන මගින් අවසර දෙන ලද පරිදි , සංචාරක කාර්ය සඳහා පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හර කිරීම මගින් ගිණුම් හිමියා විසින් ලබාගත්, භාවිතයට නොගත් ව්‍යවහාර මුදල්;

(ඇ) ප්‍රකාශයට පත් කිරීම මත ගිණුම් හිමියා විසින් ශ්‍රී ලංකාව ගෙන එහි ලද විදේශ ව්‍යවහාර මුදල් (එනම්, එකී විදේශ මුදල් නෝට්ටු එ.ජ.ඩො.15000 ඉක්මවන හෝ වෙනත් යම් විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන වන ප්‍රමාණයක් රේගු දෙපාර්තමේන්තුව වෙත ප්‍රකාශයට පත් කිරීම මත හෝ එම විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු එ.ජ.ඩො.15000ට අඩු හෝ වෙනත් යම් විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන වන ප්‍රමාණයක් බලයලත් වෙළෙන්දාට හෝ පරිසීමිත වෙළෙන්දාට සුදුසු ප්‍රකාශයක් කිරීම මත)

(ඈ) ගිණුම් හිමියා නොසලකා, පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින්, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් හෝ අක්වෙරළ බැංකු ඒකකයක පවත්වාගෙන යනු ලබන ගිණුම්වලින් සිදු කරනු ලබන හුවමාරු;

(ඉ) ගිණුම්හිමියා, ශ්‍රී ලංකාවෙන් පිටත යම් නේවාසික තැනැත්තකු හෝ ශ්‍රී ලංකාවේ නේවාසික විජාතික තැනැත්තකු වන අවස්ථාවක දී, එම ගිණුම් හිමියාගේ ම ආමුඛ ආයෝජන ගිණුමෙන් සිදු කරනු ලබන හුවමාරු;

(ඊ) මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධාන මගින් අවසර ලබා දී ඇති පරිදි, එම ගිණුම් හිමියාගේ ම ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමෙන් සිදු කරනු ලබන හුවමාරු;

(උ) වෙනත් යම් තැනැත්තකුගේ රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් සිදු කරනු ලබන හුවමාරු;

(ඌ) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හර කිරීම මගින් (හෝ මේ නියමය බලාත්මක වීමට ප්‍රථම, ගිණුම්හිමියාගේ අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන්, නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන් හෝ නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන්) මුල් හුවමාරුව සිදු කරනු ලැබ ඇත්නම්, උපචිත වන ප්‍රාග්ධනය, ප්‍රාග්ධන ලාභ සහ ශ්‍රී ලංකාව තුළ විදේශ ව්‍යවහාර මුදලින් සිදු කරනු ලබන ආයෝජනවලින් උපචිත වන වෙනත් ලැබීම්;

(එ) මේ නියමය බලාත්මක වීමට ප්‍රථම, ගිණුම්හිමියාගේ අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම, නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හෝ නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හර කිරීම මගින් මුල් ආයෝජනය සිදු කරනු ලැබ ඇත්නම්, විදේශ ආයෝජනවලින් ප්‍රතිමුඛ ආයෝජන ගිණුමට ලැබුණු ප්‍රාග්ධනය සහ ප්‍රාග්ධන ලාභ;

(ඒ) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන් විදේශ සංචාරක කාඩ්පත මත තැන්පත් කරනු ලැබූ මුදල් ප්‍රමාණය දක්වා එම ගිණුම් හිමියාගේම විදේශ සංචාරක කඩ්පතේ ඉතිරිව පවතින භාවිත නොකළ ශේෂය;

(ඔ) ගිණුම් හිමියා ශ්‍රී ලංකාවේ නේවාසික විජාතික සේවකයකු වන අවස්ථාවක දී, සේවා යෝජකයාගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුමෙන් මාසික වැටුප, සේවා ප්‍රතිලාභ හා වෙනත් අදාළ ප්‍රතිලාභ වශයෙන් සිදු කරනු ලබන හුවමාරු;

(ඕ) ගිණුම්හිමියා ශ්‍රී ලංකාවේ නේවාසික විජාතික සේවකයකු වන අවස්ථාවක දී, බැර කිරීම් සිදු කරන ලද දිනයේ දී ලබාගත් විනිමය අනුපාතයට පරිවර්තනය කරන ලද, විදේශ ප්‍රේෂණ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලය ලබාදෙන ලද ශ්‍රී ලංකා රුපියල්වලින් වන යම් මුදල් ප්‍රමාණයක්;

(ක) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධාන මගින් යම් ගනුදෙනුවලට හෝ හුවමාරුවලට අවසරය ලබා දී ඇති ප්‍රමාණය තෙක්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට පවත්වාගෙන යාම සඳහා අවසර ලබාදිය හැකි වෙනත් යම් ගිණුම් වර්ගවලින් සිදු කරනු ලබන ගනුදෙනු හෝ හුවමාරු කිරීම්;

(ග) පනතේ 8(3) වගන්තිය ප්‍රකාරව ගිණුම්හිමියාගෙන් ශ්‍රී ලංකාවෙන් පිටත උපචිතවන ප්‍රේෂණ;

(ච) ගිණුමේ රඳවනු ලැබූ අරමුදල් මත විදේශ ව්‍යවහාර මුදල්වලින් උපයාගත් පොළිය.

(3). අවසරලත් හර කිරීම්

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරන ලද යම් ප්‍රතිමුඛ ප්‍රේෂණ;

(ආ) ශ්‍රී ලංකාවේ ශ්‍රී ලංකා රුපියල්වලින් සිදුකරන ගෙවීම්;

(ඇ) ගිණුම්හිමියා නොතකා, පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට හෝ අක්වෙරළ බැංකු ඒකකයන්හි පවත්වාගෙන යන ගිණුම්වලට සිදු කරනු ලබන හුවමාරු කිරීම්;

(ඈ) ගිණුම් හිමියා ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයකු හෝ ශ්‍රී ලංකාවේ නේවාසික විජාතිකයකු වන අවස්ථාවක දී එම ගිනුම් හිමියාගේ ම ආමුඛ ආයෝජන ගිණුමකට සිදු කරනු ලබන හුවමාරු කිරීම්;

(ඉ) විදේශ සංචාරක කාඩ්පතක ගබඩා කිරීම සඳහා අරමුදල් මාරු කිරීම;

(ඊ) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ අරමුදල් උපයෝගි කරගනිමින් විදේශීය ව්‍යවහාර මුදලින් ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලැබීමට අවසරලත් යම් ආයෝජනයක් සම්බන්ධ හුවමාරු කිරීම්;

(උ) ශ්‍රී ලංකාවේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබූ විධාන මගින් අවසර දී ඇති පරිදි සංචාරක අරමුණ සඳහා එ.ජ.ඩො. 10,000 දක්වා (හෝ වෙනත් යම් විදේශීය ව්‍යවහාර මුදලින් ඊට සමාන මුදලක්) දක්වා විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ආපසු ගැනීම;

(ඌ) ගිණුම දරන්නා තාවකාලිකව ශ්‍රී ලංකාවේ නැවතී සිටින ශ්‍රී ලංකාවෙන් පිටත විජාතික නේවාසිකයකු වන අවස්ථාවකදී, විදේශ ව්‍යවහාර මුදලින් වන ආපසු ගැනීම්;

(එ) ගිණුම දරන්නා තාවකාලිකව ශ්‍රී ලංකාවේ නේවාසික විජාතික සේවකයකු වන අවස්ථාවක දී සේවා යෝජකයා වැටුප් වැඩිපුර ගෙවීම් සහ එම සේවා යෝජකයා වෙත ගෙවිය යුතු වන වෙනත් එවැනි ගෙවීමකට අදාළව එම සේවා යෝජකයාගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට සිදු කරන හුවමාරු කිරීම;

(ඒ) මේ උපලේඛනයේ 1 වන ඡේදයේ 2 (ඔ) වන අනුඡේදය පරිදි, ශ්‍රී ලංකාවේ නේවාසික විජාතික සේවකයකුට වැඩිපුර ගෙවීමක් සිදු කර ඇති අවස්ථාවක දී සේවා යෝජකයාගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම්වලට සිදුකරන හුවමාරු කිරීම්;

(ඔ) මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධානය මගින් එම ගනුදෙනු සඳහා අවසර ලබා දී ඇති තාක් දුරට, යම් ගනුදෙනු හෝ ගනුදෙනු වර්ග සම්බන්ධයෙන් නේවාසිකයන්ට විදේශ විනිමයෙන් කරනු ලබන ගෙවීම්;

(ඕ) මහ බැංකුව විසින් කලින් කලට පවත්වාගෙන යාමට අවසර දෙනු ලැබිය හැකි මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධාන මගින් එම ගනුදෙනුවලට හෝ හුවමාරු කිරීම්වලට අවසර ලබා දී තිබෙන ප්‍රමාණයට, වෙනත් යම් වර්ගයක ගිණුම්වලට සිදු කරන ගනුදෙනු හෝ හුවමාරු කිරීම්.

2. ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Business Foreign Currency Accounts - BFCAs)

(1). ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තන්

(අ) ශ්‍රී ලංකාවේ සිටින, හෝ ශ්‍රී ලංකාවෙහි නේවාසික විදේශීය විනිමය උපයන පහත දැක්වෙන තැනැත්තන්;

(i) ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයකු;

(ii) හිමිකරු හෝ හවුල්කරුවන්ගෙන් බහුතරයක් ශ්‍රී ලංකාවේ නේවාසිකයන් වන අවස්ථාවක දී ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද තනි ව්‍යාපාරයක් හෝ හවුල් ව්‍යාපාරයක් (හවුල්කරුවන් දෙදෙනෙක් සහිත හවුල් ව්‍යාපාරයක් වන අවස්ථාවක දී අවම වශයෙන් එක් හවුල්කරුවකුවත් ශ්‍රී ලංකාවෙහි නේවාසිකයකු විය යුතු ය.);

(iii) ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක්;

(iv) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ විදේශීය සමාගමක් වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගමක්;

(v) අදාළ රේඛීය අමාත්‍යාංශය හෝ අදාළ අධිකාරියේ ලේකම්වරයාගේ නිර්දේශ සහිත රාජ්‍ය ආයතනයක්;

(vi) වලංගු බලපත්‍රයක් සහිත හෝ පිළිවෙලින් වෙළඳ නැව් කටයුතු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබූ බලය පවරන ලද ලිපියක් සහිත විදේශීය නැව් සේවාවක් හෝ ගුවන් සේවාවක් (විදේශ ප්‍රධානයා) වෙනුවෙන් ශ්‍රී ලංකාවේ නැව් නියෝජිතයකු හෝ සාමාන්‍ය අලෙවි නියෝජිතයකු වශයෙන් ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලය පවරන ලද තැනැත්තකු;

(ආ) බලයලත් වෙළෙන්ද හෝ පරිසීමිත වෙළෙන්දා සමග ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් පවත්වාගෙන යනු ලැබූ මියගිය පුද්ගලයකුගේ බූදලය අද්මිනිස්ත්‍රාසිකර අවසන් වන තෙක් එම මියගිය තැනැත්තාගේ බූදලයේ අද්මිනිස්ත්‍රාසිකරු හෝ පොල්මෘකරු;

(ඇ) බලයලත් වෙළෙන්ද හෝ පරිසීමිත වෙළෙන්දා සමග ව්‍යාපාරික විදේශීය ව්‍යාවහාර මුදල් ගිණුමක් පවත්වා ගෙන යනු ලැබූ සමාගමක නමින්, එහි ක්‍රියා පටිපාටින් අවසන් වන තෙක් ලැබුම්කරු හෝ ඈවරකරු

(2). ව්‍යාපාරික විදේශීය ව්‍යවහාර මුදල් ගිණුමක් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය නොවන සංවිධානයකට අවසර ලබා නොදිය යුතු ය.

(3) අවසරලත් බැර කිරීම් -

(අ) භාණ්ඩ හා සේවා අපනයනවලට, ව්‍යාපාර කේන්ද්‍ර වෙළඳාමට, ගිණුම් හිමියා විසින් සිදු කරන ලද විදේශ ව්‍යාපෘතිවලට, ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කළ ආයෝජනවලට සහ ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික තැනැත්තකුට දේශීය වශයෙන් සපයන ලද භාණ්ඩවලට අදාළව බැංකු පද්ධතිය මාර්ගයෙන් විදේශයන්ගෙන් විදේශ විනිමයෙන් ලද ප්‍රේෂණ;

(ආ) යම් විදේශ සේවායෝජකයකුට සේවා සපයනු ලබන ශ්‍රී ලාංකිකයන්ගේ වේතන සහ /හෝ ඉපයීම් ගෙවීම සඳහා ගිණුම්හිමියා විසින් සැලැස්මක් සකස් කරගෙන ඇත්තේ යම් විදේශ සේවායෝජකයකු සමග ද එම සේවායෝජකයාගෙන් බැංකු පද්ධතිය මාර්ගයෙන් විදේශයෙන් ලද ප්‍රේෂණ ;

(ඇ) ශ්‍රී ලංකාවේ සිටින ගිණුම් හිමියකු විසින්, ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික තැනැත්තකු වෙත එම තැනැත්තා විසින් සපයන ලද භාණ්ඩ හා සේවාවලට අදාළව,පිළිගත් සංචාරක චෙක්පත්,බැංකු අණකර හෝ ව්‍යවහාර මුදල් නෝට්ටු ආකාරයෙන් වන විදේශ ව්‍යවහාර මුදල්;

(ඈ) ගිණුම් හිමියා ශ්‍රී ලංකාවේ සිටින නැව් නියෝජිතයකු හෝ සාමාන්‍ය අලෙවි නියෝජිතයකු වන විටදී, අදාළ විදේශ ප්‍රධානයාගෙන් හෝ අදාළ නියෝජිත ගිවිසුමේ කාර්ය සඳහා විදේශ ප්‍රධානයා වෙනුවෙන් නම් කරනු ලැබූ තුන්වන පාර්ශවයකින් බැංකු පද්ධතිය මාර්ගයෙන් විදේශ විනිමයෙන් ලද ප්‍රේෂණ;

(ඉ) විදේශ ප්‍රධානයා වෙනුවෙන් ශ්‍රී ලංකාවෙහි සිටින නැව් නියෝජිතයකු හෝ සාමාන්‍ය අලෙවි නියෝජිතයා විසින් ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට හෝ අක්වෙරළ බැංකු ඒකකයේ පවත්වාගෙන යනු ලබන ගිණුමකට සිදු කළ ප්‍රේෂණයක් මගින් විදේශ විනිමයෙන් ලබාගත් නැව් භාණ්ඩ ප්‍රවාහන කුලී;

(ඊ) ගිණුම්හිමියා විසින්, ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමෙන් පසු (එනම්, එම විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු එ.ජ.ඩො. 15.000 ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන අගයක් ඉක්මවන හෝ ඊට සමාන වන විටදී ශ්‍රී ලංකා රේගුවට ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමෙන් පසු හෝ එම විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු එ.ජ.ඩො 15,000 කට හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන අගයකට වඩා අඩු වන විට දී බලයලත් වෙළෙන්දාට හෝ පරිසීමිත වෙළෙන්දාට උචිත ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමෙන් පසු) ශ්‍රී ලංකාව තුළට රැගෙන එන ලද විදේශ ව්‍යවහාර මුදල්;

(උ) ගිණුම් හිමියා පිළිබඳ නොසලකමින්, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් හෝ අක්වෙරළ බැංකු ඒකකයන්හි පවත්වාගෙන යන ගිණුම්වලින් සිදු කළ හුවමාරු;

(ඌ) එකී ගෙවීම් සහ ලැබීම් හෝ ගනුදෙනු වර්ග සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ විධානයක් මගින් අවසර ලබා දී ඇති තාක්දුරට, නේවාසිකයකුට සපයන ලද භාණ්ඩ හෝ සේවා සඳහා ප්‍රතිෂ්ඨාවක් වන්නා වූ, ගිණුම්හිමියාගේ නමට විදේශ විනිමයෙන් ලද මුදල්;

(එ) ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ව අනුමතය ඇතිව, ගිණුම් හිමියා විසින් බලයලත් වෙළෙන්දකුගේ හෝ පරිසීමිත වෙළෙන්දකුගේ දේශීය බැංකු ඒකකයකින් හෝ අක්වෙරළ බැංකු ඒකකයකින් ලබා ගත් විදේශ විනිමය ණය හෝ අත්තිකාරම්වලින් උපයන ලද මුදල්;

(ඒ) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමට හර කිරීමෙන් යම් විදේශ වත්කමක් අත්පත් කර ගෙන ඇති විට දී, ගිණුම් හිමියාගේ එකී විදේශ වත්කම විකිණීමෙන් ලද මුදල් හෝ ඉන් යම් කොටසක්;

(ඔ) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමට හර කිරීමෙන් (හෝ මේ නියෝගය බලාත්මක වීමට පෙරාතුව ගිණුම්හිමියාගේ විදේශ විනිමය උපයන්නාගේ ගිණුමෙන්) මුල් හුවමාරුව සිදු කර ඇත්තේ නම්, ශ්‍රී ලංකාව තුළ සිදු කළ ආයෝජනවලින් විදේශ විනිමයෙන් උපචිත වන ප්‍රාග්ධනය, ප්‍රාග්ධන ලාභ සහ වෙනත් ලැබීම්.

(ඕ) මේ නියෝගය බලාත්මක වීමට පෙරාතුව ගිණුම් හිමියාගේ විදේශ විනිමය උපයන්නාගේ ගිණුමට හර කිරීමෙන් මුල් ආයෝජනය සිදු කර ඇත්තේ නම්, විදේශ ආයෝජනවලින් ප්‍රතිමුඛ ආයෝජන ගිණුමට ලද ප්‍රාග්ධනය සහ ප්‍රාග්ධන ලාභ.

(ක) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමට හර කරමින් මේ උපලේඛනයේ 4(ඇ) සහ 4(ඈ) ඡේද අනුව ගිණුම් හිමියා විසින් ලබා ගන්නා ලද භාවිත නොකළ විදේශ ව්‍යවහාර මුදල්;

(ග) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන් එම ගිණුම් හිමියාගේ විදේශ සංචාරක කාඩ්පතට තැන්පත් කරන ලද ප්‍රමාණය දක්වා, එකී විදේශ සංචාරක කාඩ්පතෙහි ඉතිරිව පවතින භාවිත නොකළ ශේෂය;

(ච) සුදුසුකම්ලත් පාරිභෝගිකයන්ට සහ සම රක්ෂණකරුවන්ට නිකුත් කරන ලද විදේශ ව්‍යවහාරික මුදලින් අධිනාමික රක්ෂණ ඔප්පු මත ගිණුම් හිමියා විසින් ලද රක්ෂණ වාරික සහ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගම්වලට ප්‍රති රක්ෂණකරුවන්ගෙන් සහ ජාතික රක්ෂණ භාර අරමුදලෙන් ලැබෙන රක්ෂණ හිමිකම්;

(ජ) වැටුප් සහ වෙනත් යම් ප්‍රතිලාභ පමණ ඉක්මවා ගෙවීම් වන්නා වූ, ශ්‍රී ලංකාවේ නේවාසික විජාතික සේවකයකුගේ පුද්ගලික විදේශ ව්‍යවහාරික මුදල් ගිණුමෙන් සිදු කරනු ලබන මාරු කිරීම්;

(ට) ශ්‍රී ලංකා මහ බැංකුව මගින් කලින් කලට පවත්වාගෙන යාමට අවසර ලබා දිය හැකි වෙනත් යම් ගිණුම් වර්ගයකින්, මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධානයක් මගින් එකී ගනුදෙනු සඳහා අවසර ලබා දී ඇති තාක් දුරට, සිදු කරනු ලබන හුවමාරු කිරීම;

(ඩ) පනතේ 8(3) වන වගන්තිය ප්‍රකාරව ගිණුම් හිමියකුගෙන් ශ්‍රී ලංකාවෙන් පිටත දී උපචිත වන ප්‍රේෂණ;

(ණ) ගිණුමේ පවතින අරමුදල් මත විදේශ ව්‍යවහාර මුදලින් උපයාගත් පොළිය.

(4) අවසරලත් හර කිරීම් -

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරන ලද යම් ප්‍රතිමුඛ ප්‍රේෂණ;

(ආ) ශ්‍රී ලංකාවේ දී ශ්‍රී ලංකා රුපියල්වලින් සිදු කරනු ලබන ගෙවීම්;

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධානයන් මගින් අවසර ලබා දෙන ලද සංචාරක කාර්ය සඳහා එ.ජ.ඩො. 10,000 ක් දක්වා (හෝ වෙනත් යම් විදේශ ව්‍යවහාර මුදලකින් වන ඊට සමාන අගයක්) විදේශ ව්‍යවහාර මුදලින් සිදු කරනු ලබන ආපසු ගැනීම්;

(ඈ) ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මගින් ලබා ගන්නා ලද ස්ථිර කිරීම ඉදිරිපත් කිරීමෙන් පසු යම් අවස්ථාවක දී මැණික් සහ ස්වර්ණාභරණ වෙළෙන්දන් විසින් විදේශයන්හි දී කපා ඔප දැමූ හෝ රළු මැණික් ගල් සහ අමු ද්‍රව්‍ය මිළ දී ගැනීමේ කාර්යය සඳහා එ.ජ.ඩො. 50,000 ක් දක්වා (හෝ වෙනත් යම් විදේශ ව්‍යවහාර මුදලකින් වන ඊට සමාන අගයක්) විදේශ ව්‍යවහාර නෝට්ටු මගින් සිදු කරනු ලබන ආපසු ගැනීම්;

(ඉ) ගිණුම් හිමියා ශ්‍රී ලංකාවේ නැව් නියෝජිතයකු හෝ සාමාන්‍ය වෙළෙඳ නියෝජිතයකු වන අවස්ථාවක දී බලයලත් වෙළෙන්දකුට හෝ පරිසීමිත වෙළෙන්දාට පිළිගත හැකි හේතු සහිතව කරනු ලබන ඉල්ලීමක් මත, විදේශ ප්‍රධානයාගෙන් හෝ විදේශ ප්‍රධානයා වෙනුවෙන් නම් කරන ලද තුන්වන පාර්ශ්වයකගෙන් ලද ආමුඛ ප්‍රේෂණයන් සඳහා වූ හිලව්වක් වශයෙන් පාලකයා සඳහා වූ මුදලක් (Cash-to-Masters) වශයෙන් කැඳවීමක් වෙනුවෙන් එක් නැවක් සඳහා එ.ජ.ඩො. 50,000 (හෝ වෙනත් යම් විදේශ ව්‍යවහාර මුදලකින් වන ඊට සමාන අගයක්) දක්වා විදේශ ව්‍යවහාර නෝට්ටු මගින් සිදු කරනු ලබන ආපසු ගැනීම්;

(ඊ) ගිණුම්හිමියා ශ්‍රී ලංකාවේ නැව් නියෝජිතයකු හෝ සාමාන්‍ය විකුණුම් නියෝජිතයකු වන අවස්ථාවක දී රජයට ගෙවිය යුතු බදු මුදල් සහ අනුයෝජිත කොමිස් මුදල් ඇතුළු ශ්‍රී ලංකාවේ දී විදේශ ප්‍රධානියා සතු සියලු දේශීය වගකීම් සම්පූර්ණ කිරීම සඳහා ගිණුමෙහි ප්‍රමාණවත් අරමුදල් පැවති බවට ගිණුම්හිමියාගෙන් (එනම් නියෝජිතයා) ලිඛිත ස්ථිර කිරීමක් ලබා ගෙන ඇත්නම්, අතිරික්ත අරමුදල් විදේශ ප්‍රධානියාට ආපසු යැවීම;

(උ) ගිණුම්හිමියා නොතකා, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ අක්වෙරළ බැංකු ඒකකයන්හි පවත්වාගෙන යන ගිණුම්වලට සිදු කරනු ලබන හුවමාරු කිරීම්;

(ඌ) එම ගිණුම් හිමියාගේම ප්‍රතිමුඛ ආයෝජන ගිණුමට හුවමාරු කිරීම්;

(එ) ගිණුම්හිමියා විසින් විදේශීය ණය දෙනු ලබන තැනැත්තකුගෙන් විදේශ ව්‍යවහාර මුදල් ණයක් ආපසු ගෙවීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයකුගෙන් ආමුඛ ආයෝජන ගිණුමකට හුවමාරු කිරීම;

(ඒ) විදේශ සංචාරක කාඩ්පතක් ප්‍රතිපූර්ණය කිරීම සඳහා අරමුදල් හුවමාරු කිරීම්;

(ඔ) ණය සේවා වියදම් සහ ගිණුම් හිමියා විසින් බලයලත් වෙළෙන්දන්ගෙන් හෝ පරිසීමිත වෙළෙන්දන්ගෙන් ලබාගෙන ඇති විදේශ ව්‍යවහාර මුදල් ණය ආපසු ගෙවීම;

(ඕ) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක අරමුදල් භාවිත කරමින් ශ්‍රී ලංකාවේ දී විදේශ ව්‍යවහාර මුදලින් සිදු කිරීමට අවසර ලබා දී ඇති යම් ආයෝජනයක් සම්බන්ධයෙන් වන හුවමාරු කිරීම්;

(ක) විදේශ ව්‍යවහාර මුදලින් අධිනාමික ප්‍රතිපත්ති සම්බන්ධයෙන් සුදුසුකම්ලත් පාරිභෝගිකයන්ට සහ සම-රක්ෂණකරුවන්ට හිමිකම් ගෙවීම, දේශීය හෝ විදේශීය ප්‍රති-රක්ෂණකරුවන්ට සහ ජාතික රක්ෂණ භාර අරමුදලට වාරික ගෙවීම සහ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ලියාපදිංචි රක්ෂණ සමාගම් විසින් තැරැව් ගාස්තු ගෙවීම්;

(ග) මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධාන මගින් අවසර ලබා දී ඇති තාක් දුරට, ගනුදෙනු හෝ ගනුදෙනු වර්ගයක් සම්බන්ධයෙන් නේවාසිකයන්ට විදේශීය ව්‍යවහාර මුදලින් කරන ගෙවීම්;

(ච) මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධාන මගින් යම් ගනුදෙනු හෝ හුවමාරු කිරීම් සඳහා අවසර ලබා දී ඇති තාක් දුරට ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, කලින් කලට පවත්වාගෙන යාමට අවසර ලබා දිය හැකි වෙනත් යම් ගිණුම් වර්ගයකට සිදු කරන ගණුදෙනු හෝ හුවමාරු කිරීම්;

(5) කිසිදු අවස්ථානුගත කරුණක් යටතේ ශ්‍රී ලංකා රුපියල් විදේශ ව්‍යවහාර මුදලකට පරිවර්තනය කරනු ලැබීම සහ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට බැර කරනු ලැබීම සිදු නොකළ යුතු යී

3. මේ උපලේඛනයේ කාර්ය සඳහා -

"ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය" යන්නෙන් 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ පනත යටතේ පිහිටුවන ලද ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය අදහස් වේ;

"ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය" යන්නෙන් 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය අදහස් වේ;

"වෙළෙඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නේ 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනත යටතේ පත් කරන ලද වෙළෙඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

"ජාතික රක්ෂණ භාර අරමුදල" යන්නෙන් 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත යටතේ පිහිටුවන ලද ජාතික රක්ෂණ භාර අරමුදල අදහස් වේ.

එල්. ඩී. බී 10/2017

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

8 වන වගන්තිය යටතේ වූ නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 8 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මා විසින් , මේ නියමය මගින් , ශ්‍රී ලංකාවෙහි සිටින හෝ නේවාසික තැනැත්තකු විසින් -

(අ) යම් විදේශ ව්‍යවහාර මුදල් හෝ ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම හෝ ශ්‍රී ලංකාව තුළට ආනයනය කිරීම;

(ආ) ශ්‍රී ලංකාව තුළ, විදේශ විනිමය තම සන්තකයේ හෝ බැංකු ගිණුමක තබා ගැනීම,

සිදු කිරීමේ දී යටත් විය යුතු කාර්ය, සීමාවන්, නියමයන් සහ කොන්දේසි වන මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාර්ය, සීමාවන්, නියමයන් සහ කොන්දේසි මෙයින් නියම කරනු ලැබේ.

2017 අංක 12 දරන විදේශ විනිමය පනත මගින් ඉවත් කරන ලද විනිමය පාලන පනත යටතේ සාදන ලද සහ මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති නියමයන් මෙයින් අවලංගු කරනු ලැබේ.

**රනිල් වික්‍රමසිංහ,**
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය.

2017 නොවැම්බර් මස 17
කොළඹ දී ය.

## I වන උපලේඛනය

### *I වන කොටස*

විදේශ ව්‍යවහාර මුදල් හෝ ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් ආනයනය කිරීම සහ අපනයනය කිරීම සම්බන්ධයෙන් වන කාර්ය, සීමාවන්, නියමයන් සහ කොන්දේසි.

1. (1) ශ්‍රී ලංකාවෙන් පිටතට යන්නා වූ හෝ ශ්‍රී ලංකාවට පැමිණෙන්නා වූ යම් තැනැත්තකු තමන් විසින් රැගෙන යනු ලබන විදේශ විනිමයේ මුළු අගය එක්සත් ජනපද ඩොලර් 15,000 ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන අගයක් ඉක්මවන්නේ නම්, පිළිවෙලින්, පිටත්වන හෝ පැමිණෙන තොටුපොළෙහි දී රේගු දෙපාර්තමේන්තුව වෙත ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට යටත්ව, එම තැනැත්තා විසින් නීත්‍යානුකූලව අත්පත් කරගත් ව්‍යවහාර මුදල් නෝට්ටු, බැංකු අණකර, චෙක්පත්, සංචාරක කාඩ්පත් ආදී ආකාරයෙන් වන විදේශ විනිමය ඕනෑම ප්‍රමාණයක් එම තැනැත්තා විසින් රැගෙන යනු ලැබිය හැකි ය.

(2) එසේ වුව ද, ශ්‍රී ලංකාවට පැමිණෙන තැනැත්තෙකු විසින් එක්සත් ජනපද ඩොලර් 10,000 ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන අගයක් ඉක්මවන්නා වූ විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ආපසු රැගෙන යාමට අදහස් කරනු ලබන අවස්ථාවක දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට යන තැනැත්තකු විසින් එක්සත් ජනපද ඩොලර් 10,000 ක් හෝ වෙන ත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන අගයක් ඉක්මවන්නා වූ විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු රැගෙන යනු ලබන අවස්ථාවක දී එම තැනැත්තා විසින් රේගු දෙපාර්තමේන්තුව වෙත ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වන්නේ ය.

2. ශ්‍රී ලංකාව තුළ සිටින හෝ නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් රුපියල් 20,000ක් දක්වා පිළිවෙලින් ශ්‍රී ලංකාවෙන් පිටතට රැගෙන යනු හෝ ශ්‍රී ලංකාව තුළට රැගෙන එනු ලැබිය හැකි ය.

3. යම් බලයලත් වෙළෙන්දකු විසින් සිය ව්‍යාපාරය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාමේ දී හෝ ඒ සඳහා සහ සිය බලය ලබා දීමේ නියමයන් තුළ කටයුතු කිරීමේ දී අත්පත් කරගත් විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම හෝ ශ්‍රී ලංකාව තුළට ආනයනය කිරීම කළ හැකි ය.

4. මේ කොටසේ කාර්ය සඳහා-

"බලයලත් වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

## II වන කොටස

***විදේශ විනිමය සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් වන කාර්ය, සීමාවන්, නියමයන් සහ කොන්දේසි***

1. (1) ශ්‍රී ලංකාවෙහි සිටින හෝ නේවාසික යම් තැනැත්තකු විසින් එක්සත් ජනපද ඩොලර් (USD) 10,000ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන අගයක් දක්වා විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු වශයෙන් වන විදේශ ව්‍යවහාර මුදල් :

(අ) එම තැනැත්තාගේ විදේශ සංචාර සඳහා එම තැනැත්තා විසින් බලයලත් වෙළෙන්දකුගෙන් හෝ පරිසීමිත වෙළෙන්දෙකුගෙන් මිල දී ගනු ලැබ, ශ්‍රී ලංකාවට නැවත පැමිණීමේ දී භාවිත නොකළ ව්‍යවහාර මුදල් ලෙස ආපසු ගෙන එනු ලබන විදේශ ව්‍යවහාර මුදල් ; හෝ

(ආ) එම තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික තැනැත්තකු වෙත විදේශයන්හි ලබාදෙන ලද සේවාව හෝ සපයන ලද භාණ්ඩ සඳහා වන ගෙවීම් ලෙස හෝ වෙනත් යම් නීත්‍යානුකූල මූලාශ්‍රයකින් එම තැනැත්තා ලද විදේශ ව්‍යවහාර මුදල් ; හෝ

(ඇ) සංචාරය කිරීමේ අරමුණ වෙනුවෙන් එම තැනැත්තා විසින් සිය පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් ආපසු ලබා ගත් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු,

වන්නේ නම්, මෙහි 2 වන ඡේදයේ සඳහන් කාල සීමාව පිළිබඳ සීමාකිරීම් නොසලකා ඕනෑම කාල සීමාවක් දක්වා සිය සන්තකයේ රඳවා ගනු ලැබිය හැකි ය.

(2) (අ) තීරුබදු සහන යටතේ ශ්‍රී ලංකාවේ තොටුපළවලින් ශ්‍රී ලංකාවට පැමිණෙන හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරට යන මගීන් වෙත, නේවාසික තත්ත්වය නොසලකමින් භාණ්ඩ හා සේවා සැපයීම සඳහා අවසරලත් ව්‍යාපාරයක් පවත්වා ගෙනයනු ලබන ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික තැනැත්තකුට හෝ ශ්‍රී ලංකාවෙහි සිටින හෝ නේවාසික තැනැත්තකුට යම් තැනැත්තකු විසින් සපයන ලද භාණ්ඩ හා සේවා සඳහා භාර ගත් විදේශ ව්‍යවහාර මුදල් එම තැනැත්තා විසින් සිය සන්තකයේ රඳවා තබා ගනු ලැබිය හැකි ය.

(ආ) එම තැනැත්තා විසින් එසේ භාරගත් විදේශ ව්‍යවහාර මුදල් ඒ පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු එම විදේශ ව්‍යවහාර මුදල් භාර ගත් තැනැත්තාගේ නමට පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක තැන්පත් කිරීමෙන් හෝ බලයලත් වෙළෙන්දෙකුට හෝ පරිසීමිත වෙළෙන්දෙකුට විකිණීමෙන් තොරව , භාරගත් දිනයේ සිට දින 7 ක් ඉක්මවන කාලසීමාවක් සඳහා රඳවා තබා නොගත යුතු ය.

(3) ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින විට දී අත්පත් කරගත් හෝ බලයලත් වෙළෙන්දන් හෝ පරිසීමිත වෙළෙන්දන් සමග පවත්වාගෙන යනු ලැබූ විදේශ විනිමය ගිණුම් මගින් අත්පත් කර ගත්තේ විදේශ ව්‍යවහාර මුදල් වන්නේ නම් එම විදේශ ව්‍යවහාර මුදල් එම තැනැත්තා විසින් සීමාවකින් තොරව ශ්‍රී ලංකාව තුළ සිය සන්තකයේ රඳවා තබා ගනු ලැබිය හැකි ය.

2. විදේශ විනිමය රඳවා තබා ගැනීමට අදාළ කාල සීමාව පහත සඳහන් පරිදි විය යුතු ය :-

(1) අදාළ තැනැත්තා විසින් බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දෙකු වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කාර්යය සඳහා එම බලයලත් වෙළෙන්දාගෙන් හෝ පරිසීමිත වෙළෙන්දාගෙන් ලබාගත් විදේශ ව්‍යවහාර මුදල් එකී කාර්ය සඳහා භාවිත නොකරන යම් තැනැත්තකු විසින් එකී විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමෙන් තොරව, එම විදේශ ව්‍යවහාර මුදල් ලද දිනයේ සිට දින අනූවක් (90) ඉක්මවන කාල සීමාවක් දක්වා රඳවා තබා නොගත යුතු ය.

(2) (අ) අදාළ තැනැත්තා විසින් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කාර්යය සඳහා එම බලයලත් වෙළෙන්දාගෙන් හෝ පරිසීමිත වෙළෙන්දාගෙන් විදේශ ව්‍යවහාර මුදල් ලබාගෙන ඉන්පසු එකී විදේශ විනිමය හෝ ඉන් කොටසක් ශ්‍රී ලංකාවට නැවත රැගෙන එනු ලබන යම් තැනැත්තකු විසින් එකී විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමෙන් තොරව එකී විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකාවට නැවත රැගෙන එන ලද දිනයේ සිට දින අනූවක් (90) ඉක්මවන කාල සීමාවක් සඳහා රඳවා තබා නොගත යුතු ය.

(ආ) වුව ද, සංචාරය කිරීමේ අරමුණ සඳහා 1 වන ඡේදයේ (1)

(අ) ඡේදය යටතේ එක්සත් ජනපද ඩොලර් 10,000ක අගයක් දක්වා හෝ ඒ හා සමාන අගයකින් යුත් වෙනත් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ලබා ගත් තැනැත්තෙකුට, එම විදේශ ව්‍යවහාර මුදල් බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දෙකු සමග පවත්වාගෙන යනු ලබන විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක තැන්පත් කිරීම සඳහා අවසර ලබා දිය යුතු ය.

(3) රැකියාවක් සඳහා, වෘත්තීය කාර්යයක නිරත වීම සඳහා හෝ ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටතට නික්ම ගොස් එකී රැකියාවෙන්, වෘත්තියෙන් හෝ ව්‍යාපාරයෙන් විදේශ ව්‍යවහාර මුදල් උපයාගෙන හෝ ලබාගෙන එම මුදල් ශ්‍රී ලංකාවට නැවත රැගෙන එනු ලබන යම් තැනැත්තකු විසින් එකී විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමෙන් හෝ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධි විධානවලට අනුකූලව එම තැනැත්තා විසින් ආරම්භ කර සහ/හෝ පවත්වාගෙන යනු ලබන විදේශ විනිමය ගිණුමකට බැර කිරීමෙන් තොරව එම විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකාවට නැවත රැගෙන එන ලද දිනයේ සිට දින අනූවක් (90) ඉක්මවන කාල සීමාවක් සඳහා රඳවා තබා ගැනීමට හිමිකම් නොලැබිය යුතු ය.

3. මේ කොටසේ කාර්යය සඳහා.-"බලය ලත් වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට ලබා දී ඇති අර්ථය තිබිය යුතු ය; සහ

"පරිසීමිත වෙළෙන්දා" යන්නෙන් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 4 වන වගන්තියේ (2) වන උප වගන්තියේ (අ)ඡේදය යටතේ විදේශ විනිමය වෙළඳාම් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර දී ඇති බලය ලත් වෙළෙන්දෙකු නොවන්නාවූ යම් තැනැත්තකු, තැනැත්තන් වර්ගයක් හෝ වර්ග අදහස් වේ.

## III වන උපලේඛනය

| *ගැසට් අංකය* | *නිකුත් කළ දිනය* | *අරමුණ* |
|---|---|---|
| 1947/13 | 2015.12.29 | 2017 අංක 12 දරන විදේශ විනිමය පනත මගින් ඉවත් කරන ලද (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනතේ 17 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති යටතේ නියමය |
| 1947/15 | 2015.12.29 | 2017 අංක 12 දරන විදේශ විනිමය පනත මගින් ඉවත් කරන ලද (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනතේ 6අආ වගන්තිය සමග කියවිය යුතු 44 වන වගන්තිය යටතේ නියමය |
| 1686/50 | 2011.01.01 | 2017 අංක 12 දරන විදේශ විනිමය පනත මගින් ඉවත් කරන ලද (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනතේ 17 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති යටතේ නියමය |
| 1631/36 | 2009.12.11 | 2017 අංක 12 දරන විදේශ විනිමය පනත මගින් ඉවත් කරන ලද (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනතේ 17 වන වගන්තිය යටතේ නියමය |
| 1854/3 | 2014.03.17 | 2017 අංක 12 දරන විදේශ විනිමය පනත මගින් ඉවත් කරන ලද (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනතේ 17 වන වගන්තිය යටතේ නියමය |

එල්.ඩී.බී. 10/2017

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

**31 වන වගන්තිය යටතේ වූ නියමය**

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 31 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මා විසින්, මේ නියමය මගින් , එකී පනතේ කාර්ය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් තැනැත්තන්, ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විය යුතු බවට තීරණය කරනු ලැබේ.

2017 අංක 12 දරන විදේශ විනිමය පනත මගින් ඉවත් කරන ලද විනිමය පාලන පනත යටතේ නිකුත් කරන ලද සහ 1972 අප්‍රේල් 21 දිනැති අංක 15007 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද විධාන මෙයින් අවලංගු කරනු ලැබේ.

**රනිල් වික්‍රමසිංහ,**
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය.

2017 නොවැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

1. පෙරාතුව වූ මාස 12 තුළ, සමස්තය දින 183ක් හෝ ඊට වැඩි කාල සීමාවක් සඳහා ශ්‍රී ලංකාව තුළ සිටියා වූ යම් ශ්‍රී ලාංකික පුරවැසියකු හෝ ශ්‍රී ලාංකික පුරවැසියකු හා විවාහ වී සිටින විදේශ රටක යම් පුරවැසියකු.

2. (අ) පෙරාතුව වූ මාස 12 තුළ, සමස්තය දින 182කට නොවැඩි වූ කාල සීමාවක්, නිවාඩුවක් සඳහා, අධ්‍යාපනය සඳහා, ව්‍යාපාර සඳහා, වෛද්‍ය ප්‍රතිකාර සඳහා හෝ ඒ හා සමාන වෙනත් යම් හේතුවක් මත තාව කාලිකව ශ්‍රී ලංකාවෙන් බැහැරව නික්ම ගොස් ඇති යම් ශ්‍රී ලාංකික පුරවැසියකු.

   (ආ) වෙනත් රටක් මගින් ප්‍රදානය කළ ශිෂ්‍ය වීසා බලපත්‍රයක් හෝ ඒ හා සමාන වීසා බලපත්‍රයක් මත ශ්‍රී ලංකාවෙන් බැහැරව නික්ම ගොස් ඇති යම් ශ්‍රී ලාංකික පුරවැසියකු.

3. (අ) ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික (නම් කරනු ලැබ ඇති නාමය හෝ පදවි නාමය කුමක් වුව ද එම නාමයෙන් හෝ පදවි නාමයෙන්) ශ්‍රී ලංකා රජයේ රාජ්‍ය තාන්ත්‍රික නියෝජිතයන්, කොන්සල්වරුන් හෝ වෙළඳ කොමසාරිස්වරුන්;

   (ආ) ඉහත 3 (අ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකුගේ කාර්ය මණ්ඩල සාමාජිකයකු වන්නා වූ ශ්‍රී ලාංකික පුරවැසියකු වන යම් තැනැත්තකු;

   (ඇ) ශ්‍රී ලංකාවෙන් බැහැර දී බඳවා ගනු ලැබූ තැනැත්තන් හැර, ශ්‍රී ලංකාවෙන් බැහැර සේවය කරනු ලබන, ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරනු ලැබූ රාජ්‍ය සංස්ථාවක, රාජ්‍ය ආයතනයක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, බලපත්‍රලාභී බැංකුවක හෝ සමාගමක කාර්ය මණ්ඩල සාමාජිකයකු;

   (ඈ) ඉහත 3 (අ) සිට 3 (ඇ) දක්වා වන ඡේද යටතේ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු ලෙස සලකනු ලබන යම් තැනැත්තකුගේ පවුලේ යම් සාමාජිකයකු.

4. ශ්‍රී ලංකාවේ නේවාසික හෝ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද අදාළ වීසා බලපත්‍රයක් යටතේ සේවා නියුක්තියේ යෙදුණු, එහෙත් වෙනත් රටවලට යන අතරමග සිටින මගීන් හෝ විනෝදය හෝ ව්‍යාපාර සඳහා රටේ සංචාරය කරනු ලබන සංචාරකයන් නොවන , විදේශ රටවල පුරවැසියන්.

5. හිමිකාරත්වය දරනු ලබන, පාලනය කරනු ලබන හෝ කළමනාකරණය කරනු ලබන තැනැත්තන්ගේ පුරවැසිභාවයේ තත්ත්වය නොසලකා ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ පහත සඳහන් ආයතන;

   (අ) ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සමාගම්;

   (ආ) ශ්‍රී ලංකාවෙන් බැහැරව සංස්ථාපිත කරනු ලැබූ බලපත්‍රලාභී බැංකුවල (විදේශ බැංකු) ශාඛා ඇතුළුව 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ විදේශ සමාගම්;

   (ඇ) අක්වෙරළ සමාගම් ලෙස ලියාපදිංචි කරනු ලැබූ සමාගම්;

   (ඈ) රාජ්‍ය නොවන සංවිධාන ඇතුළුව ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරනු ලැබූ සමාජ, සංගම් හෝ වෙනත් යම් සංවිධාන.

6. මියයෑම සිදු වූ අවස්ථාවේ දී, මියගිය තැනැත්තා හෝ ගිවිසුම ඇති කරගත් අවස්ථාවේ දී ගිවිසුම්කරු ඉහත 1 සිට 5 දක්වා වන ඡේද ප්‍රකාරව නේවාසිකයකු වූ අවස්ථාවක දී, හුදෙක්ම අදාළ තත්ත්වයෙහි කටයුතු කරනු ලබන විට දී, අන්තිම කැමති පත්‍ර, භාර හෝ ජීවත්වන්නන් අතර වන ගිවිසුම්හි වෙනත් රටක භාරකරුවන් සහ බූදලයන්හි අද්මිනිස්ත්‍රාසිකරුවන් හෝ අන්තිම කැමති පත්‍රයන්හි පොල්මඃකරුවන්

7. 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ අර්ථානුකූලව ශ්‍රී ලංකාවේ නැවක සේවය කළ කාල සීමාව තුළ දී, එසේ ශ්‍රී ලාංකික පුරවැසියන්.

8. ඉහත 1 වන , 2 වන , 3 වන හෝ 7 වන ඡේදයන්හි කොන්දේසි සපුරා නොමැති ශ්‍රී ලාංකික පුරවැසියන් වන ශ්‍රී ලාංකික සම්භවයක් ඇති තැනැත්තන්, මේ පනත යටතේ නිකුත් කරන ලද නියෝග, නියමයන් සහ විධානයන්ට යටත්ව, පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ආරම්භ කිරීමේ සහ පවත්වාගෙන යාමේ කාර්ය සඳහා පමණක් ශ්‍රී ලංකාවේ නේවාසිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.